# නායයෑම් ආපදා අවමකරණය තුළින් නායයෑම්වලට ගොදුරු වීමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය

## ආපදා අවදානම් ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමණාකරණ සැලැස්ම

**ආපදා අවදානම් ස්ථානීය අංක 85 (2 වන ස්ථානය)**

**ඉසිපතන මහවෙව්නා අසපුව**

**දොඩන්ගොඩ**

**කළුතර දිස්ත්‍රික්කය**

2021 මැයි

ආසියානු යටිතල පහසුකම් යෝජනා බැංකුව


ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
99/1, ජාවත්ත පාර, කොළඹ 05
දු:ක: 011 2588946/ 011 2503826/ 011 2503431

පටුන

1. හැඳින්වීම ....................................................................................................................1

1.1. ව්‍යාපෘතිය සාරාංශය ....................................................................................................1

1.2. අපේක්ෂිත පරිශීලකයින් ................................................................................................1

2. ව්‍යාපෘතිය පිලිබඳ හැඳින්වීම සහ ආපදා ස්ථානීය තොරතුරු ..............................................2

2.1. ව්‍යාපෘතියේ නම ...........................................................................................................2

2.2. ස්ථානීය තොරතුරු ..........................................................................................................2

2.3. භූ ලක්ෂණ හා ඉඩම් අයිතිය .............................................................................................3

2.4. ප්‍රදේශයේ කාලගුණික තත්වය ..........................................................................................4

2.5 විහාරස්ථානය පිළිබඳ තොරතුරු .........................................................................................4

3. නායයාම් ආපදා සිදුවීම් පිලිබඳ තොරතුරු ...........................................................................5

3.1. පෙර වාර්තා වන ලද සිදුවීම් ............................................................................................5

3.2. නායයාම් ආපදාව හේතුවෙන් සිදුවිය හැකි හානි ................................................................6

3.3. නායයාම් ආපදා අවදානම අවමකරණය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිලිබඳ විස්තරය ...............6

3.4. පදිංචි කරුවන් මෙම ස්ථානයෙන් ඉවත් කිරීම ...................................................................6

3.5. නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය (ප්‍රගතිය) ........................................................................6

4. බෑවුම් අස්ථාවර වීම සිදුව ඇති ප්‍රදේශයේ හා අවට පරිසරය පිලිබඳ විස්තරය සහ වර්තමාන අවදානම් තත්ත්වය ....................................................................................................................6

4.1. බෑවුම අස්ථාවර වීම සිදුවන අවට ප්‍රදේශය .......................................................................6

4.2. වර්තමාන අවදානම් තත්වය ..............................................................................................7

5. ව්‍යාපෘතිය යටතේ යෝජිත ආපදා අවදානම් අවමකරණය පිලිබඳ විස්තරය ..................................7

6. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑම් සිදුවිය හැකි සංරචකයන් ......................................7

7. ව්‍යාපෘතියට අදාළ අවදානම් සහ සමාජයීය හා පාරිසරික බලපෑම් හඳුනා ගැනීම .........................8

7.1. ව්‍යාපෘතියෙන් සිදුවන සාධනීය බලපෑම ..........................................................................10

7.2. අහිතකර බලපෑම් ..........................................................................................................10

8. සැලකිය යුතු පාරිසරික සහ සමාජයීය බලපෑම් ....................................................................14

8.1. සෞඛ්‍ය හා ආරක්ෂාව පිලිබඳ ගැටළු සඳහා වන ප්‍රමුඛත්වය: කොන්ත්‍රාත්කරුවන් සඳහා වන සම්මත ගිවිසුම්ගත අවශ්‍යතා ඉක්මවා සැලකිය යුතු විශේෂිත සෞඛ්‍ය ආරක්ෂාව පිලිබඳ කරුණු ...................14

8.2. ළමා ශ්‍රමය සහ බලහත්කාරී ලෙස ශ්‍රමය ලබා ගැනීම .........................................................15

9. පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම (ESMP) ....................................................15

9.1. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ........................................................................15

9.2. පුද්ගලයින් ඉවත් කිරීම .................................................................................................15

9.3. හානි වූ ගොඩනැඟිලි, පහසුකම් සහ යටිතල පහසුකම් ඉවත් කිරීම (හිමිකරුවන්ගේ එකඟතාවය ලබා ගැනීම) ...........................................................................................................................15

9.4. ව්‍යාපෘති කටයුතු හේතුවෙන් සිදුවන දේපොළ/ වත්කම් හානි සඳහා වන්දි ලබා දීම ...............15

9.5. ප්‍රජා දැනුවත් කිරීම සහ අධ්‍යාපනය - පහත ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය වේ. .................................15

9.6. ස්ථානීය විශේෂිත පාරිසරික/ සමාජයීය කළමනාකරණ කොන්දේසි ....................................15
9.7. ඉදිකිරීම් ක්‍රියාවලිය තුල සිදුවන බලපෑම් අවම කිරීම.........................................................17
10. මහජන හා පාර්ශවකරුවන්ගේ අදහස් ..................................................................................24
11. ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍ය අධිකාරිය විසින් නිකුත් කරන ලද COVID-19 සඳහා වන වැළැක්වීමේ පියවර 24
12. නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව, එකඟතාවය සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ආයතනයන්හි අනුමැතිය ලබා ගැනීම ............................................................................25
13. වැඩබිම සම්බන්ධ අභියාචනා සලකා බැලීමේ යාන්ත්‍රණය ........................................................26
14. තොරතුරු බෙදාහැරීම ...........................................................................................................27

## රූප සටහන් ලැයිස්තුව

රූපය 1 – යෝජිත ව්‍යාපෘති ස්ථානය සඳහා ප්‍රවේශ මාර්ගය ........................................................ 3
රූපය 2 – යෝජිත ආපදා අවමකරණ ස්ථානයේ බෑවුම, අවට විශේෂාංග සහ සේවා යටිතල පහසුකම් පිළිබඳ තොරතුරු දක්වන ගූගල් රූපය .................................................................................................. 4
රූපය 3- නාය යෑම් සිදු වූ ප්‍රදේශය සහ හරස්කඩ (මූලාශ්‍රය - ඩ්‍රෝන ඡායාරූපය NBRO ) .......................... 5
රූපය 4 – පසුගිය වසර පහ තුළ භූමි භාවිතයේ වෙනස්වීම් (a - 2016, b - 2017, c - 2020) (මූලාශ්‍රය - Google Earth) ........................................................................................................................ 6
රූපය 5 – ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑම් සිදුවිය හැකි සංවේදී සංරචකයන්........................... 8
රූපය 6 – ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවිය හැකි බලපෑම් හා වැදගත්කම .................................................................................................................................. 9

## වගු සටහන් ලැයිස්තුව

වගුව 1 –අහිතකර බලපෑම් හා ඒවායේ වැදගත්කම ........................................................................ 10
වගුව 2 – සැලසුම් අදියරේදී සැලකිය යුතු පාරිසරික හා සමාජයීය බලපෑම් ........................................ 16
වගුව 3 – E&HS කළමනාකරණයට අනුකූල වීම සඳහා“ කොන්ත්‍රාත්කරුවන්ගේ අවශ්‍යතාවය” .......... 18
වගුව 4 – ස්ථානීය විශේෂිත ES & HS අවමකරණ පියවරයන්............................................................ 19
වගුව 5 – ඉදිකිරීම් අදියර සඳහා පාරිසරික හා සමාජයීය අධීක්ෂණ යාන්ත්‍රණය.................................... 23
වගුව 6 – මහජන හා පාර්ශ්වකරුවන්ගේ අදහස්.................................................................................. 25
වගුව 7 – නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව, එකඟතාවය හා අනුමැතිය...................................... 25
වගුව 8 – අනුමැතීන් ලබා ගැනීම සඳහා වන දළ කාල නියමය ............................................................ 26
වගුව 9 – යෝජිත තොරතුරු බෙදාහැරීමේ යාන්ත්‍රණය .......................................................................... 27

# කෙටි යෙදුම්

| | |
|---|---|
| AIIB | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව<br>Asian Infrastructure Investment Bank |
| CEA | මධ්‍යම පරිසර අධිකාරිය<br>Central Environmental Authority |
| CEB | ලංකා විදුලිබල මණ්ඩලය<br>Ceylon Electricity Board |
| DFC | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>Department of Forest Conservation |
| DS | ප්‍රාදේශීය ලේකම්<br>Divisional Secretary |
| DWLC | වන ජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව<br>Department of Wild Life Conservation |
| EH & S | පරිසර හා සමාජ ආරක්ෂණ<br>Environmental Health & Social |
| E&SU of PMU | පාරිසරික සමාජ ආරක්ෂණ හා ව්‍යාපෘති කළමනාකරණ අංශය<br>Environmental & Social Unit of Project Management Unit |
| ESMF | පාරිසරික හා සමාජ කළමනාකරණ රාමුව<br>Environmental and Social Management Framework |
| ESMP | පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම<br>Environmental and Social Management Plan |
| GN | ග්‍රාම නිලධාරි<br>Grama Niladhari |
| GOSL | ශ්‍රී ලංකා රජය<br>Government of Sri Lanka |
| GSMB | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය<br>Geological Surveys & Mines Bureau |
| LHS | වම් පස<br>Left Hand Side |
| NBRO | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය<br>National Building Research Organization |
| RDA | මාර්ග සංවර්ධන අධිකාරිය<br>Road Development Authority |
| RHS | දකුණු පස<br>Right Hand Side |
| SSE & SMP | නිශ්චිත පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම<br>Site Specific Environmental and Social Management Plan |

# 1. හැඳින්වීම

## 1.1.ව්‍යාපෘතිය සාරාංශය

ශ්‍රී ලංකා රජය ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) හා සම්බන්ධ වෙමින් එම බැංකුවේ මුල්‍ය ආධාර මත ශ්‍රී ලංකාවේ පළාත් 06 ක දිස්ත්‍රික්ක 11 ක නාය යෑම් සිදුවන ස්ථාන පිළිසකර කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය පාරිසරික හා සමාජ ආරක්ෂණමය වශයෙන් AIIB බැංකුවේ හා ලංකා රජයේ නීතිරීති වලට අනුකූලව සිදුවිය යුතුය . ව්‍යාපෘතියේ ස්වාභාවය සහ ක්‍රියාවලිය සැලකිල්ලට ගනිමින් AIIB බැංකුව අපේක්ෂා කරන පරිදි ඔවුන්ගේ පාරිසරික හා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති වලට අනුකූල වන පරිදි පාරිසරික සහ සමාජීයය කළමනාකරණ රාමුවක් ESMF සකසා ඇත.

පාරිසරික සහ සමාජීය කළමනාකරණ රාමුවෙහි (ESMF) අරමුණු වන්නේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී AIIB බැංකුවේ ආරක්ෂණ ක්‍රමවේදය සහ ජාතික පාරිසරික හා සමාජ ප්‍රඥප්තිය පිළිබඳ මාර්ගෝපදේශයන් සැපයීමයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වශයෙන්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) සමස්ත ව්‍යාපෘතිය වෙනුවෙන් සකස් කරනු ලබන පාරිසරික හා සමාජීය කළමනාකරණ රාමුව, ව්‍යාපෘතියට අදාළ පාර්ශවයන් ඒ අකාරයෙන්ම ක්‍රියාත්මක කිරීම සහතික කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පාරිසරික ,සමාජ ,සෞඛ්‍ය හා ආරක්ෂණ තත්ත්වයන් ව්‍යාපෘති ස්ථානයෙන් ස්ථානයට වෙනස් වන බැවින් එවැනි වෙනස් වන නිශ්චිත තත්ත්වයන් පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ.එම නිසා පාරිසරික සහ සමාජීය කළමනාකරණ රාමුවට අනුව පාරිසරික සහ සමාජීය ඇගයීම් සඳහා එක් එක් නායයාම් ස්ථානයට විශේෂිත වූ පාරිසරික හා සමාජ කළමනාකරණ වාර්තා (SSE & SMP) සකසා ඇත .එම ස්ථානීය විශේෂිත පාරිසරික සහ සමාජ කළමනාකරණය පිළිබඳ සැලසුම් මඟින් විශේෂිත පිළිසකර ක්‍රමවේදයන් ,සෞඛ්‍ය, සමාජ සහ ආරක්ෂණ කළමනාකරණය සම්බන්ධයෙන් සලකා බැලිය යුතු අංශයන් පිළිබඳ ,ඉදිකිරීම් සහ මෙහෙයුම් කාලය තුල අවශ්‍ය මග පෙන්වීම් ලබා දෙනු ඇත.

ඒ අනුව, **කළුතර දිස්ත්‍රික්කයේ ඉසිපතන මහමෙව්නා අසපුව ආශ්‍රිත නායයාම් අවම කිරීමේ ස්ථානයට** අදාළ විශේෂිත පාරිසරික හා සමාජීය කළමනාකරණ සැලසුම මෙහි සවිස්තරාත්මකව දක්වා ඇත. ගැඹුරු පාරිසරික හා සමාජීය අධ්‍යනයකින් පසුව මෙම සැලසුම සකස් කර ඇති අතර පහත කරුණු පිළිබඳ ඉහළ අවධානයක් යොමු කර ඇත**.**

i. ව්‍යාපෘතියට අදාළ කලාපයේ සංවේදී පාරිසරික හා සමාජීය අංග හඳුනා ගැනීම .

ii. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් සැලකිය යුතු පාරිසරික හා සමාජීය බලපෑම් හඳුනා ගැනීම

iii. හානිය අවම කරන පියවර යෝජනා කිරීම

iv. මෙම ව්‍යාපෘතියට අදාළ වන පාරිසරික සහ සමාජ නිරීක්ෂණ අවශ්‍යතා තීරණය කිරීම

v. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කාලය තුළදී මෙම ව්‍යාපෘතියට අදාළ පාරිසරික නියමයන් හා ක්‍රියාපටිපාටීන් අධ්‍යනය කිරීම

## 1.2. අපේක්ෂිත පරිශීලකයින්

යෝජිත ව්‍යාපෘතිය සහ අවදානම් අවම කිරීමේ පියවරයන් හේතුවෙන් ඇතිවිය හැකි ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජීය කළමනාකරණ ගැටළු පිළිබඳ විස්තරයක් මෙම වාර්තාව තුලින් ඉදිරිපත් කරනු ලබයි. ව්‍යාපෘතිය යටතේ පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුවෙහි (ESMF) සංරචක ක්‍රියාත්මක කරනු ලබන පිරිසැලසුම් කණ්ඩායම (Design team), ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සහ කොන්ත්‍රාත්කරු මෙම සවිස්තරාත්මක ලේඛනය පරිශීලනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ස්ථානීය

විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ තක්සේරු වාර්තා (SSE & SMP) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙහි (NBRO) වෙබ් අඩවියේ සහ AIIB වෙබ් අඩවියෙහි ප්‍රදර්ශනය කරන අතර මේ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවයන්ට (රාජ්‍ය හෝ වෙනත් පාර්ශවකරුවන්ට) ඒවා පරිශීලනය කිරීමට හැකියාව ලැබේ. එසේම, මෙමඟින් වැඩ ආරම්භ කිරීමට ප්‍රථමව කොන්ත්‍රාත්කරු විසින් සකස් කරනු ලබන පාරිසරික හා සමාජයීය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මේ කොටසක් වන ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම්වලට අවශ්‍ය පදනම නිර්මාණය කරනු ඇත

## 2. ව්‍යාපෘතිය පිලිබඳ හැඳින්වීම සහ ආපදා ස්ථානීය තොරතුරු

### 2.1. ව්‍යාපෘතියේ නම

යෝජිත ආපදා අවදානම් ස්ථානීය අංක 85 (2 වන ස්ථානය) ඉසිපතන මහවෙච්නා අසපුව, දොඩන්ගොඩ, කළුතර දිස්ත්‍රික්කය

### 2.2. ස්ථානීය තොරතුරු

යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානය බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, සේරුපිට නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටා ඇත.

**ස්ථානයේ GPS ඛණ්ඩාංක** – 6.613818°N, 80.011862°E

***උන්නතාංශය*** – යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානයෙහි උන්නතාංශය මුහුදු මට්ටමේ සිට අඩි 115 කි. (35m).

***ආසන්නතම නගරය*** – යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානයේ සිට 10 km පමණ දුරින් කළුතර නගරය පිහිටා ඇත.

**ප්‍රවේශ මාර්ගය** – යෝජිත අවමකරණ ස්ථානය වන ඉසිපතන මහමෙව්නා අසපුව, දොඩංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති අතර කළුතර නගරයේ සිට කොළඹ - ගාලු ප්‍රධාන මාර්ගය (A02) ඔස්සේ අවමකරණ ස්ථානයට පිවිසිය හැකිය. කොළඹ දෙසින් පැමිණෙන්නෙකුට කළුතර බෝධිය පසු කර යන විට හමුවන ඔරලෝසු කණුව අසලින් වම් පසට වන්නට පිහිටි ගඟ අසබඩ මාර්ගයෙන්, එනම් පලාතොට පාර දිගේ කිලෝමීටර 8.5 ක් පමණ ගමන් කරන විට මෙම ස්ථානයට ළඟාවිය හැකි ග්‍රාමීය මාර්ගය සොයාගත හැකිය (දකුණු පස). ඒ අනුව, මෙම හන්දියේ සිට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, සෞන්දර්ය පුහුණු පාසල පසුකරමින් මීටර් 2.5 ක් පමණ ගමන් කරන විට යෝජිත අවම කිරීමේ ස්ථානයට පහසුවෙන්ම ප්‍රවේශ විය හැක.




*රූපය 1 – යෝජිත ව්‍යාපෘති ස්ථානය සඳහා ප්‍රවේශ මාර්ගය*

### 2.3. භූ ලක්ෂණ හා ඉඩම් අයිතිය

යෝජිත අවම කිරීමේ ස්ථානය ඉසිපතන මහමෙවුනා අසපු (පන්සල) පරිශ්‍රය තුළ පිහිටා ඇත. මෙම ස්ථානයේ භූ විෂමතාවය පිළිබඳ සලකා බැලීමේදී,එය වයඹ දෙසට අංශක 300 - 320 පමණ වූ ආනතියකින් යුත් සාමාන්‍ය බෑවුමකින් සමන්විත වේ. කඩාවැටීමට ලක්ව ඇති බෑවුම උසින් මීටර් 10 - 12 ක් වන අතර එහි දිග මීටර් 24 කි. මෙහි මතුපිට පාංශු ස්ථරය රොන්මඩ හා වැලි අවශේෂ වූ පාංශු ස්ථරයකින් සමන්විත වන අතර ඊට ඇතුළතින් මීටර් 1 ක් පමණ වූ ඝන කොලූවියම් පාංශු ස්ථරයක් පවතී.

මෙම විහාරස්ථානයේ භූමි ප්‍රමාණය අක්කර අටක් 08ක් පමණ වන අතර එය සමතලා මෙන්ම කඳු සහිත භූමියක පිහිටා ඇත. එහිදී ස්වභාවික බෑවුම උපයෝගී කරගෙන ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ඉඩ අවකාශය ලබා ගැනීමට, පියවර ආකාරයට එම ස්වභාවික බෑවුම වෙනස් කර ඇත. විහාර දේවාලගම් පනත යටතේ මෙම ඉඩමේ හිමිකාරීත්වය විහාරස්ථාන ඉඩමේ භාරකරු යටතේ පවතී.

(යෝජිත අවමකරණ ස්ථානීය බෑවුම, අවට විශේෂාංග සහ සේවා යටිතල පහසුකම් පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා ගූගල් රූපය.2 බලන්න.)




*රූපය 2- යෝජිත ආපදා අවමකරණ ස්ථානයේ බෑවුම, අවට විශේෂාංග සහ සේවා යටිතල පහසුකම් පිළිබඳ තොරතුරු දක්වන ගූගල් රූපය*

## 2.4. ප්‍රදේශයේ කාලගුණික තත්වය

වසරේ බොහෝ මාසවල සැලකිය යුතු වර්ෂාපතනයක් මෙම ප්‍රදේශයට ලැබෙන අතර, සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 3000කි.ඒ අනුව නිරිතදිග මෝසමෙන් වැඩි කාල සීමාවකට නිරන්තරයෙන් වර්ෂාව ලබාදෙයි. කළුතර සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය වසරකට සෙල්සියස් අංශක 28 ක් පමණ වේ.

*(මූලාශ්‍රය: ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-දොඩන්ගොඩ)*

## 2.5 විහාරස්ථානය පිළිබඳ තොරතුරු

1998 වසරේ ඉදිකරන ලද මෙම විහාරස්ථානය 2005 වසරේදී බෞද්ධ කටයුතු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇත. මෙය "මහමෙව්නා" බෞද්ධ වැඩසටහන යටතේ පිහිටුවන ලද විහාරස්ථානයකි. මෙම විහාරස්ථානය ප්‍රධාන වශයෙන් භාවනා පුහුණුව ප්‍රමුඛ කොටගත් අනෙකුත් ආගමික කටයුතු සඳහා භාවිතා වන අතර, එම භාවනා ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සපයන භාවනා කුටි සහිත මධ්‍යස්ථානයකින් සමන්විත වේ. විහාරස්ථානයේ දාගැබ ඉදිකිරීම 2017 වසරේ ආරම්භ කර ඇති අතර ඊට සමගාමීව විහාරස්ථාන පරිශ්‍රයේ අනෙකුත් පහසුකම් ද සංවර්ධනය කරන ලදී. මෙම විහාරස්ථානයේ දැනට භික්ෂූන් වහන්සේලා 20-30 ක් පමණ භාවනා ක්‍රම ප්‍රගුණ කරමින් වැඩ වාසය කරන අතර,සාමාන්‍යයෙන් පොහොය දින වලදී විහාරස්ථානය විසින් සංවිධානය කරනු ලබන ආගමික වතාවත් සඳහා බැතිමතුන් 1500 ක් පමණද, සති අන්තයේ දී බැතිමතුන් 500 ක් පමණද මෙම විහාරස්ථානයට පැමිණෙති.

## 3. නායයාම් ආපදා සිදුවීම් පිලිබඳ තොරතුරු

### 3.1. පෙර වාර්තා වන ලද සිදුවීම්

විහාරස්ථානයේ චෛත්‍යයට යාබදව දැවැන්ත රඳවුම් බැම්මක් ඉදිකිරීම සඳහා කණ්ඩි කැපීමක් සිදුකර ඇති අතර,එය බැවුම් කඩා වැටීමට හා අස්ථාවර වීමට හේතු වූ බව පෙර අධ්‍යනයන්ට අනුව තහවුරු විය.

බැවුම් වෙනස් කිරීමේදී ක්‍රමවත් ඉංජිනේරුමය බැවුම් ස්ථායීතා සම්මතයන් අනුගමනය කර නොමැති අතර, බැවුමේ ජලාපවහන කළමනාකරණය  දුර්වල මට්ටමක පවතින ලදී. තවද, අක්‍රමවත් ඉඩම් පරිහරණ ක්‍රියාමාර්ග හේතුවෙන් වැසි ජලය අධික ලෙස කාන්දු වීම නිසා බැවුමේ අස්ථාවරත්වය තවදුරටත් වර්ධනය වී ඇති අතර මේ හේතුවෙන් සුන්බුන් තැනින් තැන විසිරී පවතිනු නිරීක්ෂණය කළ හැක.






*රූප සටහන 3: නාය යෑම් සිදු වූ ප්‍රදේශය සහ හරස්කඩ (මූලාශ්‍රය - ඩ්‍රෝන ඡායාරූපය NBRO )*

2016 වසරේ සිට සිදුකරනු ලබන විවිධ ඉදිකිරීම් කටයුතු හේතුවෙන් මෙම භූමියේ වෙනස්කම් බොහෝමයක් නිරීක්ෂණය කළ හැකි වූ අතර, 2017 වසරේදී නායයෑමක් සිදුවී ඇත.



*රූපය 4- පසුගිය වසර පහ තුළ භූමි භාවිතයේ වෙනස්වීම් (a - 2016, b - 2017, c - 2020) (මූලාශ්‍රය - Google Earth)*

### 3.2. නායයාම් ආපදාව හේතුවෙන් සිදුවිය හැකි හානි

අධික වර්ෂාව පවතින අවස්ථා වලදී අස්ථායී බෑවුම හරහා පාංශු ස්ථර සහ පාෂාණ කොටස් රූරා වැටීමෙන්, විහාරස්ථාන පරිශ්‍රයෙන් හා දාගැබ ප්‍රදේශයෙන් භාවනා කුටි වලට වැඩම කරන භික්ෂූන් වහන්සේලාට, හා වන්දනාකරුවන්ට අවදානමක් ඇති වේ.

### 3.3. නායයාම් ආපදා අවදානම අවමකරණය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිලිබඳ විස්තරය

දැනට මෙම ස්ථානයේ ආපදා අවදානම අවම කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැත. කෙසේවෙතත්, බෑවුම් අස්ථාවර වීම පිළිබඳ වාර්තාවීමත් සමඟ, ජාතික ගොඩනැගිලි පයේෂණ සංවිධානයේ කළුතර දිස්ත්‍රික් නායයෑම් පර්යේෂණ හා අවදානම් අවම කිරීමේ අංශය විසින් එම ස්ථානයේ ඇති විය හැකි අවදානම අවම කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග නිර්දේශ කර ඇත.

i. බෑවුමේ වැසි ජලය කාන්දු වීම සහ එකතු වීම වැළැක්වීම සඳහා නිසි මතුපිට සහ උප මතුපිට ජලාපවහන පද්ධතියක් ඉදිකිරීම.
ii. රඳවුම් බිත්ති ඉදිකිරීම වෙනුවට අභ්‍යන්තර පාංශු ස්ථරය ශක්තිමත් කිරීමේ ක්‍රම නිර්දේශ කෙරේ.

### 3.4. පදිංචි කරුවන් මෙම ස්ථානයෙන් ඉවත් කිරීම

මෙම ස්ථානයෙන් තාවකාලිකව ඉවත් කළ යුතු අවදානම් නිවාස කිසිවක් හඳුනාගෙන නොමැත.

### 3.5. නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය (ප්‍රගතිය)

මෙම ස්ථානය සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියක් අවශ්‍ය නොවේ.

## 4. බෑවුම් අස්ථාවර වීම සිදුව ඇති ප්‍රදේශයේ හා අවට පරිසරය පිලිබඳ විස්තරය සහ වර්තමාන අවදානම් තත්ත්වය

### 4.1. බෑවුම අස්ථාවර වීම සිදුවන අවට ප්‍රදේශය

ඉසිපතන මහමෙව්නා අසපුවේ වයඹ මායිමට වන්නට බලපෑමට ලක් වූ ප්‍රදේශය පිහිටා ඇත. බෑවුම් අස්ථාවරත්වය හේතුවෙන් විහාරස්ථානයේ භාවනා කුටි,දාගැබ ඇතුළු අංගවලට සෘජුවම බලපෑම් එල්ල

වේ. තවද,  එය දාන ශාලාව, බුදු මැදුර සහ විහාරස්ථ පරිශ්‍රයේ ඇති භාවනා කුටි වැනි අනෙකුත් පහසුකම් සඳහාද ප්‍රවේශ වීමට වක්‍රාකාරව බාධා ඇති කරයි. විහාරස්ථාන සීමාවෙන් පිටත අස්ථාවර බෑවුම් ප්‍රදේශයට යාබදව නිවසක් පිහිටා තිබෙන අතර,එයටද ඉහළ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය. තවද, යෝජිත අවම කිරීමේ කටයුතු මෙම ගොඩනැඟිල්ලට ඉතා ආසන්නව සිදු කිරීමට නියමිතයි.

.

**4.2. වර්තමාන අවදානම් තත්වය**

අධික වර්ෂාව පවතින අවස්ථා වලදී අස්ථායී බෑවුම හරහා පාංශු ස්ථර සහ පාෂාණ කොටස් රූරා වැටීමෙන් විහාරස්ථාන පරිශ්‍රයේ ඇති ගොඩනැගිලි සහ අසල්වැසි නිවාස අවදානමට ලක්ව ඇත.

## 5. ව්‍යාපෘතිය යටතේ යෝජිත ආපදා අවදානම් අවමකරණය පිලිබඳ විස්තරය

අධික වැසි සහිත කාලවලදී මෙම විහාරස්ථාන පරිශ්‍රයේ තවදුරටත් කණ්ඩි කඩාවැටීමේ හා අස්ථාවරවීමේ ඉහළ හැකියාවක් ඇති අතර යෝජිත ව්‍යාපෘතිය මඟින් තව දුරටත් භූමියේ සිදුවන අස්ථාවර තත්වයන් වලක්වා ගැනීම අරමුණු කරගෙන ඇත. එබැවින් ආපදා අවම කිරීමේ ක්‍රියාමාර්ගයන් ලෙස මතුපිට ජලාපවහන කළමනාකරණය, පාංශු වැරගැන්වුම්, රඳවුම් බැම් ඉදිකිරීම් වැනි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කෙරේ.

## 6. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑම් සිදුවිය හැකි සංරචකයන්

පහත සඳහන් සංවේදී සංරචකයන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අවදානමට ලක් විය හැකිය.

- පොහොය දින වලදී සහ අනෙකුත් දින වලදී ආගමික කටයුතු සඳහා විහාරස්ථානය භාවිතා කරන භික්ෂූන් වහන්සේලා සහ වන්දනාකරුවන්,
- විහාරස්ථානයේ ගොඩනැගිලි සහ එහි අංග
- විහාරස්ථානයේ කටයුතු
- විහාරස්ථානයට යාබදව පිහිටි අසල්වැසි නිවාස

*(ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑම් සිදුවිය හැකි සංරචකයන් සඳහා රූපය 5 බලන්න)*



*රූපය 5a: විහාරස්ථ දාගැබ් වහන්සේ*



*රූපය 5b: විහාරස්ථ ගොඩනැගිලි (ආවාස ගෙය)*

| | |
|---|---|
|  |  |
| *රූපය 5c: විහාරස්ථානයට පිවිසෙන මාර්ගය* | *රූපය 5d: ආපදා අවමකරණ ස්ථානයට යාබදව පිහිටි නිවාස* |

*රූපය 5 – ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑම් සිදුවිය හැකි සංවේදී සංරචකයන්*

## 7. ව්‍යාපෘතියට අදාළ අවදානම් සහ සමාජයීය හා පාරිසරික බලපෑම් හඳුනා ගැනීම

ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවිය හැකි ධනාත්මක සහ ඍණාත්මක බලපෑම් සහ ඒවායේ වැදගත්කම පහත වගුව මඟින් සාරාංශ කර දැක්විය හැකිය.

**බලපෑම**

**7.1 සාධනීය බලපෑම**

| |
|---|
| විහාරස්ථානය පරිශ්‍රයේ වැඩවසන ස්වාමීන්ද්‍රයන් වහන්සේලාගේ, වන්දනාකරුවන්ගේ හා එහි පවතින භෞතික ගොඩනැගිලි වල ආරක්ෂාව වැඩිදියුණුවීම |
| විහාරස්ථානයට යාබදව පිහිටා ඇති නිවාස වල ආරක්ෂාව වැඩිදියුණු වීම |

**7.2 අහිතකර බලපෑම**

**7.2.1 ජල විද්‍යාත්මක හා ජලයේ ගුණාත්මක බව**

| | |
|---|---|
| ප්‍රදේශයේ ජලාපවහන රටාවේ බලපෑම් | වැදගත් |
| ජල දූෂණ බලපෑම් | නොවැදගත් |
| ඛාදන බලපෑම් | නොවැදගත් |
| විවෘත මලපහ කිරීම් සහ ජලය ආශ්‍රයෙන් සිදුවන ආසාදන තත්ත්වයන් | නොවැදගත් |
| පහළ බෑවුමේ ජල මූලාශ්‍ර භාවිතා කරන්නන්ට ඇතිවන බලපෑම් | නොවැදගත් |
| භූගත ජල මට්ටමට හා ජලයේ ගුණාත්මකභාවයට ඇතිවන බලපෑම් | මධ්‍යස්ථ |
| ජලයට හා තෙත්බිම් වලට වන බලපෑම් | නොවැදගත් |

**7.2.2 පාරිසරික බලපෑම්**

| | |
|---|---|
| ශබ්දය හා කම්පන බලපෑම | ඉතා වැදගත් |
| වායු දූෂණ බලපෑම | ඉතා වැදගත් |
| ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා වන බලපෑම | ඉතා වැදගත් |
| පිපුරුම් අනතුරු සහ අන්තරායකර ද්‍රව්‍ය නිසා වන බලපෑම | නොවැදගත් |

**7.2.3සමාජ විද්‍යාත්මක බලපෑම්**

| | |
|---|---|
| වනජීවී වාසස්ථානයන්ට සිදුවන බලපෑම | නොවැදගත් |
| වෘක්ෂලතාවන්ට සිදුවන බලපෑම | නොවැදගත් |
| කෘෂිකර්මාන්තයට සිදුවන බලපෑම් | නොවැදගත් |
| කම්පන බලපෑම් හේතුවෙන් ගොඩනැගිලි වල ඇතිවන ඉරිතැලීම් | ඉතා වැදගත් |
| ඉඩම් සහ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා ප්‍රවේශය අහිමි වීම | වැදගත් |
| ජීවනෝපාය/ ව්‍යාපාර සහ ආදායම් ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම් | නොවැදගත් |
| සේවා සැපයීම කෙරෙහි ඇතිවන බලපෑම් (ජල සැපයුම, අපද්‍රව්‍ය, විදුලිය) | වැදගත් |

**7.2.4සමාජ ආර්ථික බලපෑම්**

| | |
|---|---|
| යටිතල පහසුකම් ආරක්ෂාව අහිමි වීම හේතුවෙන් වන බලපෑම් | වැදගත් |
| ඉදිකිරීම් අතරතුර මඟින් යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානයට පිවිසීමේ අවදානම | ඉතා වැදගත් |
| ඉදිකිරීම් අතරතුර පිටස්තර පුද්ගලයින් පිවිසීමේ අවදානම | වැදගත් |
| කඳවුරු භූමිය සහ අනෙකුත් අවශ්‍යතා | ඉතා වැදගත් |
| වැඩබිම් ශ්‍රමිකයින් හා ප්‍රජාව අතර සම්බන්ධතා සහ ගැටුම් ඇතිවීම | ඉතා වැදගත් |
| ප්‍රතිකර්ම කළ යුතු ප්‍රදේශය තුළ ව්‍යාපාර, කෘෂිකර්මාන්තය හෝ වෙනත් සඳහා භාවිතා කරන ප්‍රදේශ | නොවැදගත් |
| ව්‍යාපාර, කෘෂිකර්මාන්තය හෝ වෙනත් ක්ෂණිකව යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානට යාබදව භාවිතා කරන ප්‍රදේශ | නොවැදගත් |
| යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානයට ඇතුළු වීමට හෝ හරහා ගමන් කිරීමට අවශ්‍ය වීම | ඉතා වැදගත් |

*රූපය 6 – ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවිය හැකි බලපෑම් හා වැදගත්කම*

### 7.1. ව්‍යාපෘතියෙන් සිදුවන සාධනීය බලපෑම

- බෑවුම් වල ඇතිවන අස්ථායිතාවය තව දුරටත් ව්‍යාප්ත වීම අවම කිරීම මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වේ. ඒ අනුව දැනට අවදානමට ලක්ව ඇති බෞද්ධ විහාරස්ථාන පරිශ්‍රයේ අස්ථාවර බෑවුමට ඉහළින් පිහිටි භාවනා කුටි සහ අනෙකුත් ගොඩනැගිලි මෙම ව්‍යාපෘතිය හරහා ආරක්‍ෂා කෙරෙන අතර අනාගතයේදී සිදුවිය හැකි කණ්ඩි කඩා වැටීම් වලින් ආරක්ෂා වනු ඇත.
- තවද, අවම කිරීමේ ක්‍රියාමාර්ග හරහා මෙම ස්ථානයට යාබදව පදිංචිව සිටින පුද්ගලයින්ගේ ආරක්ෂාව වැඩි කරනු ඇත.
- දැනට විහාරස්ථානයේ වැඩවසන 20-30 ක් පමණ භික්ෂූන් වහන්සේලා සිය භාවනා ප්‍රගුණ කිරීමේ කටයුතු සඳහා මෙම අසපු පරිශ්‍රය තුළ ඇති ගොඩනැගිලි හා පහසුකම් භාවිතා කරනු ලබයි.
- සාමාන්‍යයෙන්, පොහොය දින වලදී විහාරස්ථානය විසින් සංවිධානය කරනු ලබන ආගමික කටයුතු සඳහා වන්දනාකරුවන් 1500ක් පමණ සහභාගී වන බව වාර්තා විය.
- යෝජිත ව්‍යුහාත්මක අවම කිරීමේ ක්‍රියාමාර්ග හරහා බෑවුම් ස්ථායීතාවය වැඩිදියුණු වීම හේතුවෙන් විහාරස්ථානයේ සහ එහි දේපලවල ආරක්ෂාව සැලකිය යුතු ලෙස වැඩි වේ.

### 7.2. අහිතකර බලපෑම්

මෙම ව්‍යාපෘතියෙන් යෝජිත අවදානම් අවම කිරීමේ පියවරයන් අස්ථාවර වී ඇති බෑවුම් ප්‍රදේශයට පමණක් සීමා වේ. එබැවින් මෙම ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවිය හැකි අහිතකර බලපෑම් මෙම ස්ථානයට සහ ඉදිකිරීම් කාලයට පමණක් සීමා වේ.

*වගුව 1 –අහිතකර බලපෑම් හා ඒවායේ වැදගත්කම*

| ඉදිකිරීම් කාලය අතරතුර සිදුවන බලපෑම් | බලපෑමේ ස්වභාවය |
|---|---|
| **7.2.1 ජල විද්‍යාත්මක හා ජලයේ ගුණාත්මකභාවයට සිදුවන බලපෑම** | |
| **7.2.1.1 ප්‍රදේශයේ ජලාපවහන රටාවට සිදුවන බලපෑම**<br><br>අස්ථායී බෑවුම් ප්‍රති නිර්මාණය කිරීම, පස් ඉවත් කිරීම සහ පවතින ජලාපවහන සහ මතුපිට ගලා යන ප්‍රවාහ මාර්ග වෙනතකට හැරවීම යන හේතූන් නිසා ප්‍රදේශයේ පවතින මතුපිට හා උප මතුපිට ජලාපවහන රටාවට බාධා ඇතිවේ. මෙම යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානයේ අවම කිරීමේ කටයුතු බොහෝ දුරට ජලාපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. ජල මාර්ග වෙනස් කිරීම, කාණු කැපීම් ආදිය නිසා උප මතුපිට ජලාපවහනය වැඩි වී වැසි කාලවලදී මෙම ප්‍රදේශය හරහා වැඩි ප්‍රවේගයකින් ජලය ගලායාමක් සිදුවිය හැක. | වැදගත් |
| **7.2.1.2 ජල දූෂණය නිසා සිදුවිය හැකි බලපෑම්**<br><br>ආපදා අවම කිරීමේ ස්ථානයට යාබදව ජල මාර්ග කිසිවක් නොපවතී. | නොවැදගත් |
| **7.2.1.3 ඛාදනයෙන් ඇතිවන බලපෑම්**<br><br>ආපදා අවම කිරීමේ ස්ථානයට යාබදව ජල මාර්ග කිසිවක් නොපවතී. | නොවැදගත් |
| **7.2.1.4 විවෘත ස්ථානවල මලද්‍රව්‍ය බැහැර කිරීම හා ජලයෙන් රෝග අසාදනය වීම**<br><br>ආපදා අවම කිරීමේ ස්ථානය විහාරස්ථානයක් තුළ විවෘත භූමියක පිහිටා ඇති බැවින් මලද්‍රව්‍ය බැහැර කිරීමට ඇති හැකියාව බොහෝදුරට අඩුය. | නොවැදගත් |
| **7.2.1.5 පහළ බෑවුමේ ජල මූලාශ්‍ර භාවිතා කරන්නන්ට ඇතිවන බලපෑම්** | නොවැදගත් |

| | |
|---|---|
| ආපදා අවම කිරීමේ ස්ථානයට යාබදව ජල මාර්ගයක් හෝ ජලය සපයන ජල නල කිසිවක් නොපවතී. | |
| **7.2.1.6** භූගත ජල මට්ටමට හා ජලයේ ගුණාත්මකභාවයට ඇතිවන බලපෑම් <br><br> බැවුම් ප්‍රදේශය ආශ්‍රිතව සිදු කෙරෙන ආපදා අවමකරණ ක්‍රියාකාරකම් හේතුවෙන් භූගත ජල මට්ටම පහළ යාමේ හැකියාවක් පවතී. | මධ්‍යස්ථයි |
| **7.2.1.7** ජලයට හා තෙත්බිම් වලට වන බලපෑම් <br><br> ආපදා අවම කිරීමේ ස්ථානයට යාබදව ජල මාර්ග කිසිවක් නොපවතී. | නොවැදගත් |
| **7.2.2 පාරිසරික බලපෑම්** | |
| **7.2.2.1 ශබ්දය හා කම්පන බලපෑම්** <br><br> ආපදා අවම කිරීමේ භූමිය සැකසීමේදී හා භූමි අලංකරණ කටයුතු සඳහා භාවිත කරන යන්ත්‍රෝපකරණ වලින් ශබ්දය හා කම්පනය අපේක්ෂා කළ හැකිය. විහාරස්ථානයට සහ නේවාසික ප්‍රදේශයට යාබදව ඉදිකිරීම් සිදු කරන බැවින් යන්ත්‍ර සූත්‍රවලින් ජනනය වන ශබ්දය නිවැසියන්ට, වන්දනාකරුවන්, භික්ෂූන් වහන්සේලාට සහ ඔවුන්ගේ කාර්යයන්ට බාධා ඇතිකළ හැකි බැවින් එහි බලපෑම සලකා බැලිය යුතු ය. <br><br> බර යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීමේදී ජනනය වන කම්පනය හේතුවෙන් යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානයට ඉතා සමීපව පිහිටා ඇති විහාරස්ථාන ගොඩනැගිලිවලට සහ යාබද නිවාස වලට බලපෑම් ඇතිවිය හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස බිත්ති ඉරිතැලීම් සහ කඩා වැටීම් වැනි ව්‍යුහාත්මක බලපෑම් සිදු විය හැක. එබැවින් මෙම යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානයේ කම්පන බලපෑම් ද ඉතා වැදගත් ලෙස සැලකේ. | ඉතා වැදගත් |
| **7.2.2.2 වායු දූෂණ බලපෑම** <br><br> වාහන ගමනාගමනය, භූමිය එළිපෙහෙළි කිරීම හා වැලි, සිමෙන්ති වැනි ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා කිරීම හා හැසිරවීම මඟින් නිකුත් වන දූවිලි හා වායූන් හේතුවෙන් මෙම ස්ථානය හා ඒ අවට ඇති වායුවේ ගුණාත්මකභාවයට බලපෑම් එල්ල විය හැකිය. ඉදිකිරීම් අතරතුර කොන්ක්‍රීට්, සිමෙන්ති, ලී සහ ගල් වැනි ද්‍රව්‍ය වලින් සාමාන්‍යයෙන් වැඩි වශයෙන් දූවිලි ජනනය කරයි. <br><br> යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානයට යාබදව විහාරස්ථානය හා නිවාස පිහිටා ඇති හෙයින් භික්ෂූන් වහන්සේලාට, ශිෂ්‍යයින්ට, වන්දනාකරුවන්ට සහ ප්‍රදේශයේ වෙසෙන ජනතාවට ඇතිවන වායු දූෂණ බලපෑම වඩාත් සැලකිය යුතු වේ. | ඉතා වැදගත් |
| **7.2.2.3 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම** <br><br> ඉදිකිරීම් අදියරේදී කසළ, ආහාර අපද්‍රව්‍ය සහ ඉදිකිරීම් අපද්‍රව්‍ය වැනි ඝන අපද්‍රව්‍ය දුර්වල ලෙස කළමනාකරණය කිරීම මෙම ස්ථානය භාවිතාකරන්නන්ට අපහසුතාවයක් ඇති කිරීමට හේතු විය හැක. <br><br> තවද, කාණු පද්ධතිය අවහිර වී ජලයෙන් සම්ප්‍රේෂණය වන වාහකයන් සහ රෝග කාරක උවදුරු සඳහා අභිජනන ස්ථාන බවට පත් වීමේ ඉහළ හැකියාවක් පවතී. ඉදිකිරීම් කාලය තුළ නිසි බැහැර කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවන්නේ නම් අපද්‍රව්‍ය මගින් පස දූෂණය වී විවිධ පාරිසරික බලපෑම් ඇති කළ හැකිය. මීට පෙර ඉදිකරන ලද රැඳවුම් බිත්තියේ පවතින සුන්බුන් ද මෙම ආපදා අවමකරණ ස්ථානයෙන් ඉවත් කළ යුතුය. | ඉතා වැදගත් |

| | |
|---|---|
| **7.2.2.4 පිපුරුම් හා අන්තරායකර ද්‍රව්‍ය**<br><br>හානියට ලක්ව ඇති ප්‍රදේශය තුල පාෂාණ කුට්ටි නිරීක්ෂණය නොවූ හෙයින් පුපුරණ ද්‍රව්‍ය භාවිත කිරීම හෝ පාෂාණ පිපිරවීම අපේක්ෂා නොකෙරේ. | නොවැදගත් |
| **7.2.3 ජෛව විද්‍යාත්මක/ පරිසර විද්‍යාත්මක බලපෑම** | |
| **7.2.3.1 වැදගත් වනජීවී වාසස්ථානයන්ට සිදුවන බලපෑම**<br>ආපදා අවදානම් අවමකරණ ස්ථානය ආශ්‍රිතව ඉහළ ජෛව විවිධත්වයක් සහිත සංරක්ෂිත වනාන්තර/ වනජීවී සංරක්ෂණ කලාප හෝ වනජීවී වාසස්ථාන නොමැත. | නොවැදගත් |
| **7.2.3.2 සතුන්ට හා ශාක වලට සිදුවන බලපෑම**<br><br>මෙම ස්ථානය ආසන්නයේ ඇති ශාක අතරින් හඳුනාගත් අවේනික, තර්ජනයට ලක් වූ හෝ රතු දත්ත ලැයිස්තුවට ඇතුලත් ශාක නිරීක්ෂණය කළ නොහැක. | නොවැදගත් |
| **7.2.4 සමාජීය සහ ආර්ථික බලපෑම්** | |
| **7.2.4.1 යෝජිත ප්‍රදේශයට ආසන්නතම ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු කෙරෙහි ඇතිවන බලපෑම්**<br>යෝජිත අවමකරණ ප්‍රදේශයට යාබදව කිසිදු කෘෂිකාර්මික කටයුත්තක් නිරීක්ෂණය කළ නොහැක. | නොවැදගත් |
| **7.2.4.2 කම්පනය නිසා ගොඩනැගිළි වල සිදුවන ඉරිතැලීම්**<br><br>යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානයට ආසන්නයේ ගොඩනැගිලි කිහිපයක් පිහිටා ඇත. ඒ අනුව, විහාරස්ථානයේ දාගැබ, භාවනා කුටි සහ නිවාස මෙම අස්ථායී බෑවුමට ආසන්නව පිහිටා ඇත.තවද විවිධ උන්නතාංශවල පිහිටා ඇති වෙනත් විහාර ගොඩනැගිලි ද මෙම භූමියේ නිරීක්ෂණය කළ හැක.<br>ඉදිකිරීම් අතරතුර දී භාවිතා කරන බර යන්ත්‍ර සූත්‍ර වලින් ඇති වන කම්පනය හේතුවෙන් මෙම ගොඩනැගිලිවල ඉරිතැලීම් ඇති විය හැකි අතර එය බෑවුමට ආසන්න ගොඩනැගිලිවල ස්ථායීතාවයටද බලපානු ඇත. | ඉතා වැදගත් |
| **7.2.4.3 ඉඩම් හා ප්‍රවාහන යටිතල පහසුකම් සඳහා ප්‍රවේශය අහිමි වීම**<br><br>ප්‍රධාන පිවිසුම් මාර්ගයට යාබදව ඉදිකිරීම් කටයුතු සිදු නොකරන බැවින් පදිකයින්ට සහ වාහනවලට බලපෑමක් ඇති නොකරයි. කෙසේ වෙතත්, භාවනා කුටි, බුදු මැදුර, ආවාස ගෙය සහ අනෙකුත් පහසුකම් සඳහා ප්‍රවේශ විය හැකි මාර්ගයක්, දාගැබ සහ යෝජිත ඉදිකිරීම් භූමිය අතර පිහිටා ඇත.<br><br>එබැවින්, ඉදිකිරීම් කාලය තුළ විහාරස්ථානය භාවිතා කිරීමේදී යම් යම් බලපෑම් ඇතිවිය හැකි බැවින්, අවමකරණ ස්ථානයට සමීපව ඇති ඉහළ සඳහන් කළ පිවිසුම් මාර්ගය තාවකාලිකව වසා දැමිය යුතු අතර ඒ සඳහා වෙනත් විකල්ප මාර්ග භාවිතා කළ යුතුය. | වැදගත් |
| **7.2.4.4 ජීවනෝපාය, ව්‍යාපාර සහ අදායම් මාර්ග කෙරෙහි ඇතිවන බලපෑම**<br><br>යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානය විහාරස්ථානයක් තුළ පිහිටා ඇති නිසා ප්‍රදේශයේ ජීවනෝපාය, ව්‍යාපාර හෝ ආදායම් කටයුතුවලට සැලකිය යුතු බලපෑමක් නැත. | නොවැදගත් |

| | |
|---|---|
| **7.2.4.5 සේවා සැපයීම කෙරෙහි ඇතිවන බලපෑම් (ජල සැපයුම, අපද්‍රව්‍ය, විදුලිය)**<br><br>ඉදිකිරීම් කටයුතු වලදී සහ යන්ත්‍ර සූත්‍ර එහා මෙහා ගෙන යාමේදී අවම කිරීමේ ස්ථානය හරහා දිවෙන විදුලි රැහැන්, ජල මාර්ග වලට හානි සිදු වේ. | වැදගත් |
| 7.2.4.**6 යටිතල පහසුකම් ආරක්ෂාව අහිමි වීම හේතුවෙන් වන බලපෑම්**<br><br>ඉදිකිරීම් කටයුතු බොහෝමයක් විහාරස්ථාන පරිශ්‍රයේ අස්ථාවර බැවුම් ප්‍රදේශය තුළ සිදුකරන බැවින් ඉදිකිරීම් අදියරේදී යටිතල පහසුකම් වලට සැලකිය යුතු බලපෑමක් ඇතිකරයි. කෙසේ වෙතත්, ඉදිකිරීම් අතරතුර විහාරස්ථානය භාවිතා කරන්නන්ට ආරක්ෂාව සපයමින් වෙනත් ප්‍රවේශ මාර්ගයක් සැපයීමට කොන්ත්‍රාත්කරු විසින් අවධානය යොමු කළ යුතුය. | වැදගත් |
| **7.2.4.7 ඉදිකිරීම් අතරතුර පුද්ගලයින් වැඩබිමට පිවිසීමේ අවදානම**<br><br>මෙම වැඩබිම තුළ ඉදිකිරීම් හා කැණීම් සඳහා අවදානම් සහිත යන්ත්‍රෝපකරණ භාවිතා කෙරේ. ඇතැම් යන්ත්‍රෝපකරණ භාවිත කිරීම සඳහා අධි වෝල්ටීයතාවක් සහිත විදුලිය භාවිත කරයි. එසේම ඉදිකිරීම් සඳහා ලෝහ හා වානේ වැනි ද්‍රව්‍ය භාවිතා වන අතර ඒවා නුසුදුසු ලෙස ගබඩා කිරීම හා හැසිරවීම යටතේ හානිකර විය හැකිය. එබැවින් යන්ත්‍ර සූත්‍ර නොසැලකිලිමත් ලෙස ක්‍රියාත්මක කිරීමෙන් වන්දනාකරුවන්ට හා පදිකයින්ට මාරාන්තික තුවාල හා අනතුරු සිදුවිය හැකිය. | ඉතා වැදගත් |
| **7.2.4.8** වැඩබිම කඳවුරු හා අනෙකුත් ස්ථානීය අවශ්‍යතාවයන්<br><br>වැඩබිම් කඳවුරු සඳහා සුදුසු ස්ථානයක් විහාරස්ථාන පරිශ්‍රයෙන්ම තෝරාගනු ලැබේ. කඳවුරු කළමනාකරණය නිසිපරිදි සිදු නොවන්නේ නම්, පොදු සම්පත් පරිහරණය, ශබ්දය නිසා ඇතිවන ගැටළු හා අපද්‍රව්‍ය කළමනාකරණය වැනි කාරණයන්හිදී අසල්වැසි ප්‍රජාව සමඟ සමාජයීය ගැටළු ඇතිවිය හැකිය. වැඩබිමට ආසන්නයේ තාවකාලික කඳවුරු ඉදි කරන්නේනම්, අපජලය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ගැටළුවක් විය හැකිය. | වැදගත් |
| **7.2.4.9** වැඩබිම සේවකයින්, විහාරස්ථානය පරිශීලනය කරන්නන් (භික්ෂූන් සහ වන්දනාකරුවන්) හා අසල්වැසි ප්‍රජාව **අතර සම්බන්ධතා හා ගැටුම් ඇතිවීම**<br>මෙම යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානයේ ඉදිකිරීම් කටයුතු වල නිරත වන කම්කරුවන් විවිධ සමාජ පසුබිම්වලින් සහ විවිධ ප්‍රදේශවලින් පැමිණෙන අය වන අතර ඔවුන් බොහෝ විට දරිද්‍රතාවයෙන් පෙළෙන, දුර්වල අධ්‍යාපනික සහ සමාජ පසුබිමක් ඇති අය වේ. එවැනි කම්කරු ප්‍රජාවන්ගෙන්, විහාරස්ථානය පරිශීලනය කරන්නන්ට හා අසල්වැසි ප්‍රජාවට පහත දක්වා ඇති පරිදි විවිධ සමාජමය ගැටලු ඇති කළ හැක.<br>• ඉදිකිරීම අතරතුරදී භික්ෂූන් වහන්සේලා, පරිශීලකයන් සහ අසල්වැසි ප්‍රජාව අතර සබඳතා<br>• ගම්වැසියන් අතර ඇතිවන සබඳතා සහ ඉදිකිරීම් භූමියෙන් පිටත සිදුවන ඉදිකිරීම් කටයුතු.<br>• ඉදිකිරීම් සහ ඉදිකිරීම් නොවන කාලය තුළ වැඩබිම සේවකයින්ගේ හැසිරීම්<br>• විහාරස්ථාන පරිශ්‍රයේදී සේවකයින්ගේ හැසිරීම්<br>• පෝය දින සහ සති අන්තවල සිදු කෙරෙන ඉදිකිරීම් කටයුතු<br><br>එවැනි ගැටළු වලට යොමුවන කම්කරුවන් දුර්ලභ වුවද, එවැනි දේ සිදුවිය හැකි අහඹු අවස්ථා වුවද නොසලකා හැරිය නොහැක. එබැවින්, මෙම යෝජිත ආපදා | ඉතා වැදගත් |

| | |
|---|---|
| අවම කිරීමේ ස්ථානයේ ඉහත දක්වා ඇති ගැටළු ඉතා වැදගත් ලෙස සලකනු ලැබේ. | |
| **7.2.4.10 ඉදිකිරීම් අතරතුර ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව**<br><br>වැඩබිම තුළදී ශ්‍රමිකයින් අනතුරු සඳහා නිරාවරණය වීමේ වැඩි ප්‍රවණතාවක් ඇත. ඉතා සීමිත ඉඩකඩක් තුළ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ භාවිතා කිරීම නිසා මෙම වැඩබිම තුළ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ හා රථ වාහන හේතුවෙන් මාරාන්තික අනතුරු ඇතිවීමේ ඉහළ අවදානමක් පවතී. කොන්ත්‍රත්කරු ඉදිකිරීම් කටයුතු සඳහා ළමා ශ්‍රමිකයින් යොදා ගතහොත් එය දැඩි අවදානම්කාරී හා අනතුරුදායී කටයුත්තක් බවට පත්වේ. | ඉතා වැදගත් |
| **7.2.4.11 ප්‍රතිස්ථාපනය කළ යුතු ප්‍රදේශය තුල පිහිටා ඇති ව්‍යාපාර, කෘෂිකාර්මික බිම් සහ අනෙකුත් ස්ථාන**<br><br>ව්‍යාපෘතියෙන් බලපෑම් එල්ල වන ප්‍රදේශය තුළ ව්‍යාපාර, විශේෂිත කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරන ප්‍රදේශ නොමැත. | නොවැදගත් |
| **7.2.4.12 ප්‍රතිස්ථාපනය කළ යුතු ප්‍රදේශයට යාබදව පිහිටා ඇති ව්‍යාපාර, කෘෂිකාර්මික බිම් සහ අනෙකුත් ස්ථාන**<br><br>යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානයට යාබදව ව්‍යාපාර, විශේෂිත කෘෂිකාර්මික කටයුතු හෝ වෙනත් වාණිජ කටයුතු සඳහා භාවිතා කරන ප්‍රදේශයක් නොමැති නිසා එමගින් සැලකිය යුතු බලපෑමක් නැත. | නොවැදගත් |
| **7.2.4.13 වැඩබිමට පුද්ගලයින් ඇතුළුවීම හා වැඩබිම හරහා ගමන් කිරීම**<br><br>විහාරස්ථානය පරිශීලනය කරන්නන්ට (භික්ෂූන් සහ වන්දනාකරුවන්),පදිකයින්ට හා අසල්වැසි ප්‍රජාවට වෙනත් අරමුණු සඳහා යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානයට ඇතුළු වීමට විශේෂ අවශ්‍යතාවයක් නොමැත. කෙසේ වෙතත්, ඔවුන්ට යෝජිත ආපදා අවමකරණ ස්ථානයට චේතනාන්විත හෝ නොදැනුවත්ව අවසරයකින් තොරව ඇතුළු විය හැකි අතර, අදාළ ස්ථානය තුළ පවතින යන්ත්‍රෝපකරණ, වාහන, විදුලිය සහ පිපිරුම් ද්‍රව්‍ය නිසා ඔවුන් අවදානමට ලක්විය හැකිය. | ඉතා වැදගත් |

## 8. සැලකිය යුතු පාරිසරික සහ සමාජයීය බලපෑම්

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (NBRO) හි විශේෂ අවධානයන් අවශ්‍ය වන පාරිසරික සමාජීය, බලපෑම් හෝ අවදානම් තත්ත්වයන්

### 8.1. සෞඛ්‍ය හා ආරක්ෂාව පිලිබඳ ගැටළු සඳහා වන ප්‍රමුඛත්වය: කොන්ත්‍රාත්කරුවන් සඳහා වන සම්මත ගිවිසුම්ගත අවශ්‍යතා ඉක්මවා සැලකිය යුතු විශේෂිත සෞඛ්‍ය ආරක්ෂාව පිලිබඳ කරුණු

දැනටමත් අස්ථායි විය හැකි බෑවුම් ප්‍රදේශයක අවදානම අවම කිරීමේ ක්‍රියාකාරකම් කිරීමට අපේක්ෂා කරන බැවින් බෑවුමේ අස්ථායිතාවය නිසා ඉදිකිරීම් ශ්‍රම බලකාය මුහුණ දිය හැකි අවදානම ඉහලය. ESMFහිදී එවන් පොදු පරිසර හා සමාජ ආරක්ෂණ ගැටළු සාකච්ඡාකර ඇත. ඉදිකිරීම් වැඩ බිමෙහි සේවක ආරක්ෂක අවශ්‍යතාවයන් පිලිබඳ ඉදිරිපත් කරන ලද වාර්තාවේ 2003 කොටස : වැඩ කරන තත්ත්වයන්

සහ ප්‍රජ සෞඛ්‍ය හා ආරක්ෂාව හි 2003 5 :ආරක්ෂක උපකරණ සහ ඇඳුම් යන කොටස යටතේ වඩාත් සවිස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

**8.2. ළමා ශ්‍රමය සහ බලහත්කාරී ලෙස ශ්‍රමය ලබා ගැනීම**

වැඩ කරන තත්ත්වයන් සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව පිලිබඳ චක්‍ර ලේඛනයේ 2003.3 වගන්තියට අනුව ළමා ශ්‍රමය සහ බලහත්කාරී ලෙස භාවිතා කිරීම පිළිබඳව සවිස්තරාත්මකව දක්වා ඇත

## 9. පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම (ESMP)

7 සහ 8 කොටස් වලදී හඳුනාගන්නා ලද අවදානම් තත්ත්ව සහ බලපෑම විශේෂයෙන් සලකා බලමින් එම අවදානම් අවම කිරීම හෝ කළමනාකරණය කිරීම සඳහා ක්‍රියාමාර්ග ඉදිරිපත් කරයි . මෙය ව්‍යාපෘතියේ සැලසුම් කිරීම ,ඉදිකිරීම් අවධිය සහ නඩත්තු කරමින් ක්‍රියාත්මක කිරීමේ අවධිය යන සියලු අවධි සඳහා, පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම හි (ESMP) ඇති විශේෂ නිර්දේශ සහ අවශ්‍යතා ඇතුලත් වනු ඇත.

### 9.1. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම

මෙම ස්ථානය සම්බන්ධයෙන් ව්‍යාපෘතිය පදනම්ව පවුල් නැවත පදිංචි කිරීමේ අවශ්‍යතාවයක් මතු නොවේ.

### 9.2. පුද්ගලයින් ඉවත් කිරීම

මෙම ස්ථානය අස්ථායී පහළ බෑවුමේ පිහිටා ඇති බැවින්, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේලා තාවකාලිකව ඉවත් කළ යුතු වේ. නමුත්, ඉදිකිරීම් කාලය තුල පහළ බෑවුම් ප්‍රදේශය "පිවිසුම් තහනම් කලාපයක්" ලෙස නම් කළ යුතුය.

### 9.3. හානි වූ ගොඩනැඟිලි, පහසුකම් සහ යටිතල පහසුකම් ඉවත් කිරීම (හිමිකරුවන්ගේ එකඟතාවය ලබා ගැනීම)

අදාළ කොටස් ඉවත් කිරීම සඳහා විහාරස්ථානයේ හිමිකාරී ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අවසරය ලබා ගත යුතුය.

### 9.4. ව්‍යාපෘති කටයුතු හේතුවෙන් සිදුවන දේපොළ/ වත්කම් හානි සඳහා වන්දි ලබා දීම

ඉදිකිරීම් වලදී විහාරස්ථානයේ ගොඩනැගිලි, අසල්වැසි නිවාස, යටිතල පහසුකම් හෝ වෙනත් කිසියම් අංගයකට යම් හානියක් සිදුවුවහොත් වන්දි ගෙවීමක් සිදුකළ යුතුය.

### 9.5. ප්‍රජා දැනුවත් කිරීම සහ අධ්‍යාපනය - පහත ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය වේ.

i. ඉදිකිරීම් කරන අවදියේදී ඇති විය හැකි අවදානම පිළිබඳ පැහැදිලි කිරීම සඳහා විහාරස්ථ භික්ෂූන් වහන්සේලා හා වන්දනාකරුවන් වෙනුවෙන් විශේෂ දැනුවත් කිරීමක් අවශ්‍ය වේ.

### 9.6. ස්ථානීය විශේෂිත පාරිසරික/ සමාජයීය කළමනාකරණ කොන්දේසි

පාරිසරික හා සමාජීය හේතු සාධක සලකා බලා පහත සඳහන් පාරිසරික හා සමාජ සැලසුම් නිර්දේශ කෙරේ.

*වගුව 2 – සැලසුම් අදියරේදී සැලකිය යුතු පාරිසරික හා සමාජයීය බලපෑම්*

| සැලසුම් අංගය | ව්‍යාපෘති ප්‍රදේශයට සලකා බැලීම සඳහා නිර්දේශිත මට්ටම |
|---|---|
| i. **ස්වභාවික සම්පත් කළමනාකරණය සහ සම්පත් ප්‍රශස්ථ ලෙස සැලසුම්කරණය**<br>වෘක්ෂලතාදිය ඉවත් කිරීම සහ වැඩුණු ශාක විශේෂ අවම වශයෙන් ඉවත් කිරීම සඳහා ව්‍යාපෘති විශේෂ සැලසුම් සලකා බැලිය යුතුය .වැදගත් ශාක විශේෂ හඳුනා ගතහොත් එම ශාක සංරක්ෂණය කිරීම පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් ඉදිරිපත් කල යුතුය. | මධ්‍යස්ථ |
| ii. **වැඩබිම සැලසුම් කිරීම**<br>යෝජිත ප්‍රදේශය සැලසුම් කිරීමේදී අස්ථාවර බෑවුම් සක්‍රිය වීම් හා පාංශු කොටස් චලනයන් සම්බන්ධයෙන් ප්‍රවේශම් විය යුතුය. එබැවින්. රථගාල්,ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථාන සහ තාවකාලික කුඩාරම් ආදිය අධි අවදානම් ප්‍රදේශ තුල ස්ථාපිත නොකිරීමට වගබලා ගත යුතුය. | ඉතා ඉහළ |
| iii. **සතුන්ගේ වාසස්ථාන හා ගමන් මාර්ග**<br>ස්ථිර ඉදිකිරීම් සඳහා හෝ ප්‍රවේශය සඳහා හෝ ගැඹුරු කාණු පද්ධති සකස් කිරීම සඳහා පාරිසරික වශයෙන් සංවේදී වාසස්ථාන වල වෘක්ෂලතාදිය ඉවත් කිරීමට අවශ්‍ය නම් ,එම සම්බන්ධතා නොබිඳෙන ලෙස සත්ත්ව මංපෙත් සහ වෘක්ෂලතා තීරු සැලසුම් වල ඇතුලත් විය යුතුය. | පහළ |
| iv. **ජල සම්පත් සංරක්ෂණය**<br>අවදානම් අවමකරණ පියවරක් වශයෙන් මෙම භූමියෙන් භූගත ජලය ඉවත් කරන්නේ නම් සහ එම ජලය ප්‍රමාණාත්මකභාවයෙන් හා ගුණාත්මකභාවයෙන් ඉහළ නම් එය ගෙවතු වගාව සහ සනීපාරක්ෂක කටයුතු වැනි දේ සඳහා භාවිතා කරන ජල මූලාශ්‍රයක් ලෙස සැලකිය හැකිය. යෝජිත අවම කිරීමේ ස්ථානයට ආසන්නව පූතික ටැංකිය පිහිටා ඇති බැවින් ජලයේ ගුණාත්මකභාවය පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය. | පහළ |
| v. **ජල සැපයුම් මාර්ග හා ජලාපවහන මාර්ග වලට බාධා කිරීම**<br><br>පහළ බෑවුමට ජලය සපයන ජල මාර්ග මෙම අස්ථායී බෑවුම හරහා ගමන් කරයි. | පහළ |
| vi. **සෞන්දර්යාත්මක නිර්මාණ සලකා බැලීම**<br>සෞන්දර්යාත්මක සංවේදී පරිසරයක නිර්මාණයන් කිරීමේදී ස්වභාවික පරිසරය හා සංකලනය වෙමින් දෘශ්‍ය පරිසර දූෂණය අවම මටටමක තබා ගැනීමට සැලසුම් කිරීමට සැලකිලිමත් විය යුතුය. මෙහිදී අවම කිරීමේ කටයුතු විහාරස්ථ දාගැබ ප්‍රදේශයට ආසන්නව සිදුකරන බැවින් එය චෛත්‍යය වහන්සේ දෘශ්‍යමාන වීමට බලපෑම් ඇති නොවිය යුතුයි.මේ සඳහා සුදුසු ආපදා අවම කිරීමේ ව්‍යුහයන් සැකසීමේදී භූ දර්ශන ශිල්පියකුගේ සේවය වැදගත් විය හැකිය. | ඉතා ඉහළ |
| vii. **හරිත පාරිසරික ලක්ෂණ සලකා බැලීම**<br>ආපදා අවම කිරීමේ කටයුතු බොහොමයක් සිදුකරනු ලබන්නේ පරිසර හිතකාමී සංවේදී වාසස්ථාන වල බැවින් පරිසර හිතකාමී හරිත පාරිසරික සැලසුම් පිළිබඳව හැකි තාක් සැලකිලිමත් වීම වඩාත් උචිතය: උදාහරණ ලෙස, පාංශු ඛාදනය පාලනය සඳහා දේශීය වෘක්ෂලතා විශේෂ භාවිතා | ඉහළ |

| | | |
|---|---|---|
| | කිරීම, විශේෂ විවිධත්වය පවත්වා ගැනීම සඳහා ශාක සංයෝජනයන් යොදා ගැනීම සහ ආක්‍රමණශීලි සහ වෙනත් විශේෂ යොදා නොගැනීම වැනි දෑ දැක්විය හැකිය | |
| viii. | **ශ්‍රමිකයින්ගේ සහ ප්‍රජාවගේ ආරක්ෂාව**<br>ඉදිකිරීම් අදියරේදී බෑවුම් අස්ථාවර වීම් සිදුවිය හැකි අතර කම්කරුවන්ට, ප්‍රජාවට හා භාවිතාකරන්නන්ට එය තර්ජනයක් විය හැකිය. එබැවින්, පිරිසැලසුම්කරණයේදී එම පාර්ශවල ආරක්ෂාව සඳහා ආරක්ෂිත තැනි (Berms), ආරක්ෂිත දැල් (Safety nets) සහ ආරක්ෂිත වැටවල් (Safety Fence) වැනි ආරක්ෂිත ක්‍රමවේදයන් පිළිබඳ අවධානය යොමු කළ යුතුය. | ඉතා ඉහළ |
| ix. | **බාදනය අවම කිරීමේ ව්‍යුහයන්**<br>වැසි කාලවලදී ජලාපවහනයේ වේගය සැලකිය යුතු ලෙස ඉහල යා හැකි අතර අස්ථායි බෑවුම හරහා ජලය ගලයාමද වේගවත් විය හැක. මෙම ජලය අසල ප්‍රදේශයක පිහිටි වැසි ජලය ගලායන කාණු පද්ධතියකට යොමුකළ යුතුය. එබැවින් බෑවුම් වල බාදනය අඩු කිරීම සඳහා ප්‍රමාණවත් වේග කඩනයන් යනාදිය පිලිබඳ සැලසුම් අදියරේදී සලකා බැලිය යුතුය. | ඉහළ |
| x. | **අවම පසු නඩත්තු කිරීම් සහ මෙහෙයුම් සැලසුම් කිරීම**<br><br>ආපදා අවම කිරීමේදී භූ විදුම් කාණු වැනි ශිල්පීය ක්‍රම පිලිබඳ සලකා බැලිය යුතුය. නිවැරදි විශ්කම්භයෙන් යුතු නළ සහ භූ විදුම්, නිවැරදි බෑවුම් ආනතිය වැනි ක්‍රම භාවිතයෙන් කාණු අවහිරවීම අවම කළ යුතුය. කාණු ජලය ස්වභාවික ගංගා වලට යොමු කිරීමට අපේක්ෂා කරන්නේ නම්, නඩත්තු අඩු ව්‍යුහයන් හා බාදනයන්ට ඔරොත්තු දෙන රොන්මඩ තැන්පතු වැනි සැලසුම් සලකා බැලිය යුතුය.<br>ව්‍යුහයන් සඳහා භාවිත කරන ද්‍රව්‍ය ඉහල කල් පැවැත්මක් සහිත කාලගුණික තත්වයන්ට ඔරොත්තු දෙන පරිදි ප්‍රවේශමෙන් තෝරා ගත යුතුය. වානේ ව්‍යුහයන් භාවිත කරන්නේනම් විඛාදනය වැළක්වීමේ ක්‍රම සම්බන්ධයෙන් විශේෂයෙන් සලකා බැලිය යුතුය. | ඉහළ |

## 9.7. ඉදිකිරීම් ක්‍රියාවලිය තුල සිදුවන බලපෑම් අවම කිරීම

- **ඉදිකිරීම් අදියර තුළ කොන්ත්‍රාත්කරුගේ අවශ්‍යතා පාරිසරික හා සමාජයීය කළමනාකරණය ප්‍රමිතීන් හා අනුකූල වීම**

පාරිසරික සහ සමාජීය බලපෑම් අවම කිරීම හා කළමනාකරණය කිරීම සඳහා වන ක්‍රියාමාර්ග සාමාන්‍යයෙන් සියලු නායයෑම් අවම කිරීමේ ස්ථාන සඳහා පොදු වේ. මෙම බලපෑම් බොහෝ දුරට ඉදිකිරීමේ කටයුතුවල ක්‍රියාකාරිත්වයට හේතු වේ .එබැවින් ඉදිකිරිමේදී වන බලපෑම් අවම කිරීම කොන්ත්‍රාත්කරුගේ යුතුකමකි .ඉදිකිරීම් අදියරේදී පාරිසරික, සමාජ සහ සෞඛ්‍ය ආරක්ෂණය (ES & HS ) කළමනාකරණයට අනුකූලව කොන්ත්‍රාත්කරුවන්ගේ අවශ්‍යතාව කෙසේ විය යුතුද යන්න පිළිබඳව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් සකස්කර ඇති සවිස්තරාත්මක වාර්තාවේ සඳහන් කරුණු ඒ ආකාරයෙන්ම ලන්සු ලේඛනයේ ඇතුලත් විය යුතුය.

මෙම කොටස සඳහා අදාළ අංශ වල ගුණාත්මක භාවය දැක්වෙන ප්‍රධාන කොටස් පහත වගුවේ දක්වා ඇත. වැඩි විස්තර සඳහා උක්ත වාර්තාව පරිශීලනය කල යුතුය.

| යොමු අංකය ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ට ESMP | සංරචකය | ව්‍යාපෘතියට අදාළත්වය |
|---|---|---|
| **2002.** පාරිසරික සහ සමාජ අධීක්ෂණය | | |
| 2002.2 1) | වැඩබිම තුල ගබඩා කිරීම | අතිශයින් වැදගත්වේ (විහාරස්ථානයේ කළමණකරණය) |
| 2002.2 2) | ශබ්ද හා කම්පන | අතිශයින් වැදගත්වේ (ව්‍යාපෘති ක්‍රියාකරකම් විහාරස්ථානයට හා නිවාස වලට අදාළ බැවින්) |
| 2002.2 3) | ගොඩනැගිලි ඉරිතැලීම් සහ හානි සිදු වීම | අතිශයින් වැදගත්වේ (විහාරස්ථාන ගොඩනැගිලි හා නිවාස ඒකක) |
| 2002.2 4) | අපද්‍රව්‍ය බැහැර කිරීම | අතිශයින් වැදගත්වේ (විහාරස්ථානයට අදාළ ක්‍රියාකාරකම්) |
| 2002.2 5) | අබලි ද්‍රව්‍ය බැහැර කිරීම | අතිශයින් වැදගත්වේ (විහාරස්ථානයට අදාළ ක්‍රියාකාරකම්) |
| 2002.2 6) | දූවිලි පාලනය කිරීම | අතිශයින් වැදගත්වේ |
| 2002.2 7) | ඉදිකිරීම් ද්‍රව්‍ය සහ අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම | අතිශයින් වැදගත්වේ |
| 2002.2 8) | ජලය | වැදගත් |
| 2002.2 9) | ශාක සහ සතුන් | ඇතැම්විට අදාළ වේ |
| 2002.2 10) | භෞතික සහ සංස්කෘතික සම්පත් | වැදගත් |
| 2002.2 11) | පාංශු ඛාදනය | අතිශයින් වැදගත් |
| 2002.2 12) | පාංශු දූෂණය | වැදගත් |
| 2002.2 13) | පොලොව කැණීම | වැදගත් |
| 2002.2 14) | පාෂාණ ලබාගැනීමේ ක්‍රියාවලි | අදාළ නොවේ |
| 2002.2 15) | වාහන සහ යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව (දූෂණය) | අතිශයින් වැදගත් |
| 2002.2 16) | මහජනතාවට සිදුවන අවහිරතා | අතිශයින් වැදගත් |
| 2002.2 17) | පොදු පහසුකම් හා යටිතල පහසුකම් | අතිශයින් වැදගත් |
| 2002.2 18) | දෘශ්‍ය පරිසරය වැඩි දියුණු කිරීම | අතිශයින් වැදගත්(දාගැබට ආසන්නව වැඩබිම පිහිටි නිසා) |
| **2002.5.** පාරිසරික අධීක්ෂණය | මූලික සමීක්ෂණය (වායු ,ජලය ,ශබ්දය ,කම්පන සහ ඉරිතැලීම් සමීක්ෂණ ) | ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම බලන්න |
| | ඉදිකිරීම් අතරතුර සමීක්ෂණය (වායු ,ජලය ,ශබ්දය ,කම්පන සහ ඉරිතැලීම් සමීක්ෂණ ) | ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම බලන්න |
| | වැඩබිම් මෙහෙයුම් කාලය තුල සමීක්ෂණ | ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම බලන්න |
| | ලේඛන වාර්තා කිරීම සහ පවත්වාගෙන යාම | වැදගත් |
| **2003.** සේවා කොන්දේසි සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව | | |
| 2003.2 | සුරක්ෂිත සංවිධානය සහ සන්නිවේදනය | අතිශයින් වැදගත් |
| 2003.3 | ළමා ශ්‍රමය සහ බල කිරීම | අතිශයින් වැදගත් |

| | | |
|---|---|---|
| 2003.4 | ආරක්ෂක වාර්තා සහ අනතුරු පිලිබඳ වාර්තා | අතිශයින් වැදගත් |
| 2003.5 | ආරක්ෂිත උපකරණ සහ ඇඳුම් පැළඳුම් | අතිශයින් වැදගත් |
| 2003.6 | ආරක්ෂිත බව පරික්ෂා කිරීම | අතිශයින් වැදගත් |
| 2003.7 | මූලික ප්‍රථමාධාර පහසුකම් | අතිශයින් වැදගත් |
| 2003.8 | සෞඛ්‍ය සහ ආරක්ෂාව පිලිබඳ තොරතුරු සහ පුහුණුව | අතිශයින් වැදගත් |
| 2003.9 | සුරක්ෂිත සංවිධානය සහ සන්නිවේදනය | අතිශයින් වැදගත් |
| *අදාල : මෙම වගන්තිය ඕනෑම ව්‍යාපෘති ස්ථානයකට අදාල පොදු එකක් ලෙස ව්‍යාපෘති ස්ථානය අදාළ වේ .<br>අතිශයින්ම වැදගත් : **ESPM** වලට අදාලව එම ස්ථානයට නිශ්චිතවම ක්‍රියාත්මක වන පරිදි පාරිසරික ක්‍රමවේදයන් සකස් කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විශේෂ අවධානය යොමු කල යුතුය .<br>ඇතැම්විට අදාළ වේ : ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අදාළ ව්‍යාපෘති ස්ථානයට පිවිසෙන විට මෙම **ESMP** ක්‍රියාත්මක කරනු ලැබේ .<br>අදාළ නොවේ: තොරතුරු අනාවරණය වූ කොන්දේසි යටතේ මෙම ව්‍යාපෘති ස්ථානට අදාළ විය නොහැක<br>විකල්ප : අවශ්‍ය වන්නේ නම් පමණි<br>ස්ථානීය විශේෂිත නිරීක්ෂණ සැලැස්මක්: කොන්ත්‍රාත්කරුව විසින් සඳහන් කර ඇති අධීක්ෂණ අවශ්‍යතා වලට අමතරව ස්ථානීය විශේෂිත නිරීක්ෂණ සැලැස්මෙහි සඳහන් වන පරිදි කොන්ත්‍රාත්කරු විසින් අධීක්ෂණය කිරීම සඳහා බැඳී සිටි යොමු කිරීම : කොන්ත්‍රාත්කරුවන් **ESMP** ක්‍රියාත්මක කිරීම සඳහා බැඳී සිටී.* | | |

- **ස්ථානීය විශේෂිත අවදානම් අවමකරණය**

ඉදිකිරීම් කාලයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ස්ථානීය විශේෂිත අවදානම් අවමකරණ පියවර පහත දැක්වේ.

*වගුව 4 – ස්ථානීය විශේෂිත ES & HS අවමකරණ පියවරයන්*

| අවදානම් අවමකිරීමේ සංරචක | ව්‍යාපෘතියේ අදියර | වගකීම |
|---|---|---|
| **i. ඉදිකිරීම් ක්‍රියාවලිය අතරතුර සිදුවන බාදනය වීමේ බලපෑම් අවම කිරීම**<br>වර්ෂා කාල සීමාවන්හිදී වැඩබිම එළි පෙහෙළි කිරීම, බෑවුම නැවත සකස් කිරීම සහ සුන්බුන් ඉවත් කිරීම වැනි කාර්යන්වල නොයෙදීමට දැඩිව නිර්දේශ කෙරේ. එබැවින් ඉහළ බෑවුමේ අවදානම් අවමකරණ කටයුතු වියලි කාල සීමාවන්හිදී පමණක් සිදු කිරීමටත්, වර්ෂා කාල සීමාවන්හිදී අස්ථායි බෑවුමේ එවැනි කටයුතු සිදු නොකිරීමත් දැඩිව නිර්දේශ කෙරේ. මේ පිලිබඳව ව්‍යාපෘති සැලසුම් අදියරේදී අවධානය යොමු කල යුතුය. තවද බෑවුම සකස් කිරීමේදී ඇති වූ සුන්බුන් හේතුවෙන් කාණු පද්ධති පිරී යාම වැලැක්වීමට රොන්මඩ තැන්පතු හඳුන්වා විය යුතුය. | ස්ථානය සකස් කිරීම හා ඉදිකිරීම් අදියර | කොන්ත්‍රාත්කරු |
| **ii. ව්‍යපෘති ක්‍රියාකාරකම් සැලසුම් කිරීම**<br>කොන්ත්‍රාත්කරු අදාළ විහාරස්ථානය තුල ආපදා අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කල යුතු බැවින්, ඉදිකිරීම් කටයුතු සඳහා කළමනාකරණ සැලැස්මක් සකස් කළ යුතුය. එම සැලැස්ම තුල වැඩබිමෙහි ඉඩ පහසුකම් උපරිමයෙන් උපයෝජනය වන හා ආරක්ෂාව උපරිම වන පරිදි ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා කිරීම, රථ වාහන නැවැත්වීම, කොන්ක්‍රීට් මිශ්‍ර කිරීම සහ පිරිසිදු කිරීම වැනි | ස්ථානය සකස් කිරීම හා ඉදිකිරීම් අදියර | කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| කායීයන් ස්ථාපිත කිරීම සඳහා සුදුසු ස්ථාන තෝරා ගැනීම් කළ යුතුය. | | |
| **iii. ප්‍රවේශය තහනම් කලාප**<br><br>ඉදිකිරීම් අදියරේදී මෙම ස්ථානයේ බැවුම් අස්ථාවර වීමේ අවදානම පිලිබඳව PMU විසින් සවිස්තරාත්මක තක්සේරුවක් සිදු කරමින් " ඇතුළු නොවන කලාපයක්" ප්‍රකාශ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.<br>එසේම වාහන ධාවනයේදී සිදුවන අනතුරු, යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීමේදී සිදුවන අනතුරු හා විදුලි කාන්දුවීම් ආදිය අවම කිරීම සඳහා සෞඛ්‍ය හා ආරක්ෂිත කළමනාකරණ සැලැස්මේ ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු අතර අනතුරු ඇඟවීමේ සංඥා පුවරු මෙම ස්ථානය තුළ ප්‍රදර්ශනය කළ යුතු බව දැඩිව නිර්දේශ කරයි. | ඉදිකිරීම් අදියර | E & S ඒකකය<br>PMU<br>කොන්ත්‍රාත්කරු |
| **iv. ඉදිකිරීම් ද්‍රව්‍ය සහ යන්ත්‍ර සූත්‍ර ප්‍රවාහනය**<br><br>ඉදිකිරීම් අදියරේදී යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය සහ වාහන ප්‍රවාහනය සඳහා මෙම යෝජිත ආපදා අවදානම් අවමකරණ ප්‍රදේශය තුළ පවතින කොන්ක්‍රීට් මාර්ගය භාවිතා කළ යුතුය. එබැවින් සිදුවිය හැකි අනතුරු හා මාර්ගයට සිදුවන හානි ඉහළ මට්ටමක පවතින බැවින් දැඩි අවධානයෙන් සිටිය යුතුය.<br>යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ප්‍රවාහනයේදී විහාරස්ථානයේ පිවිසුම් දොරටුව කෙරෙහිද අවධානය යොමුකළ යුතු අතර, විහාරස්ථානයේ උපදෙස් මත වන්දනාකරුවන් සඳහා විකල්ප වාහන නැවැත්වීමේ පහසුකම් සකසා දිය යුතුය. | ඉදිකිරීම් අදියර | E & S ඒකකය<br>PMU<br>කොන්ත්‍රාත්කරු |
| **v. ආක්‍රමණික විශේෂ**<br><br>ශාක ස්ථරය බාදනයට ලක්වන අවමකරණ ක්‍රියාමාර්ගයන් භාවිතා කිරීමෙන් වැළකිය යුතු අතර ශාක පාලනය සඳහා එම පරිසරයට ආවේණික දේශීය ශාක තෝරා ගත යුතුය. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| ***vi.* ශබ්දය හා කම්පන පාලනය**<br><br>විහාරස්ථානයේ ආගමික ක්‍රියාකාරකම් නිසි පරිදි පවත්වාගෙන යාමට ශබ්ද සහ කම්පන උත්පාදන ක්‍රියාකාරකම් හේතුවෙන් බාධාවක් වනු ඇත. භෞතික ව්‍යුහයන්ට සිදුවිය හැකි හානි අවම වන පරිදි කම්පන උත්පාදන කටයුතු නියමිත සීමාවන් තුළ සිදු කළ යුතුය. ව්‍යාපෘතිය අවසන් කිරීමට පෙර, අතරතුර සහ පසුව ගොඩනැගිලිවල ඉරිතැලීම් නිරීක්ෂණය කළ යුතුය.<br>ඉදිකිරීම් කටයුතු හේතුවෙන් ගොඩනැගිලි වල ඉරිතැලීම් සිදුවුවහොත් හෝ ඉරිතැලීම් විශාල වශයෙන් වුවහොත් සුදුසු පරිදි වන්දි ගෙවීමක් කළ යුතුය | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| **vii. ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීම**<br><br>වැඩබිමේ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධව කොන්ත්‍රාත්කරු විසින් විශේෂ අවධානයක් යොමුකළ යුතුය. එහිදී, මෙම වැඩබිම ආශ්‍රිතව ඇතිවන අපද්‍රව්‍ය එම ස්ථානයේදීම සෝදා හැරීම නොකළ යුතු අතර PMU විසින් අනුමත ක්‍රමවේදයකට බැහැර කළ යුතුය. විහාරස්ථාන පරිශ්‍රයේ හෝ පිවිසුම් මාර්ගය දෙපස කිසිසේත්ම ඝන අපද්‍රව්‍ය බැහැර නොකළ යුතුය. | ස්ථානය සකස් කිරීම හා ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **viii. දුහුවිලි සහ වායු දූෂණ පාලන ආවරණ**<br><br>දුහුවිලි උත්පාදනය අවම කිරීමට කොන්ත්‍රාත්කරු වගබලා ගත යුතු අතර එමඟින් පදිකයින්ට හා යාබද පදිංචිකරුවන්ට හිරිහැරයක් නොවිය යුතුය. අධික දුහුවිලි හෝ වායු අංශු නිකුත් වන අවස්ථාවන්හිදී විශේෂිත ආවරණ මඟින් ඒවා පිටතට යාම වැළක්විය යුතුය. | ස්ථානය සකස් කිරීම හා ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **ix. ඉදිකිරීම් සඳහා ජලය**<br><br>ඉදිකිරීම් සඳහා ජලය ලබා ගත යුත්තේ අනුමත ස්ථානවලින් පමණි. කොන්ත්‍රාත්කරු විහාරස්ථානයෙන් ජලය සහ විදුලිය භාවිතා කිරීමට අදහස් කරන්නේ නම්, විහාරාධිකාරී ස්වාමින්ද්‍රයන් වහන්සේලා දැනුවත් කර අවශ්‍ය අවසරය ලබා ගත යුතුය. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **x. මූලික සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටළු**<br><br>වැඩබිමෙහි සේවකයින්ට ඉහළ අවදානම් තත්වයන් යටතේ වැඩ කිරීමට සිදුවන බැවින්, “සේවා කොන්දේසි සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව” පිළිබඳ ESMP හි කොන්ත්‍රාත්කරුවන්ගේ වගකීම පිළිබඳ 2003 වගන්තියේ දක්වා ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය වේ. විධිමත් සංවිධාන හා නියාමන ක්‍රමවේදයක් යටතේ මෙම නිර්දේශ දැඩි අවදානයකින් ක්‍රියාත්මක කළ යුතුය.<br>i. මීට අමතරව, වැසි සමයේදී පාෂාණ කඩාවැටීම් සහිත ලිහිල් පස් කණ්ඩි මත වැඩ කිරීම ඉතා අවදානම් සහිත බැවින් , වර්ෂා කාලය අවසන් වන තුරු ඉදිකිරීම් කටයුතු නතර කළ යුතුය.<br>ii. සේවකයින්ගේ සහ මහජනයාගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මෙම ප්‍රදේශයට අනතුරු ඇඟවීමේ පද්ධතියක් සහ පූර්ණ කාලීන මුරකරුවන් නිර්දේශ කල යුතුය.<br>iii. පාෂාණ කඩා වැටීමේ අවදානමෙන් කම්කරුවන්ට සහ ස්ථානීය පරිශීලකයන්ට වන අවදානම අවම කිරීම සඳහා අවදානම් ස්ථානවල ආරක්ෂිත බාධක සහ ආරක්ෂිත දැල් සවි කළ යුතුය.<br>iv. තවද,වෙනත් අනතුරු සඳහා නිසි හදිසි කළමනාකරණ ඒකකයක් (ප්‍රථමාධාර පහසුකම්, ආරක්ෂිත ද්‍රව්‍ය, රෝහල්ගත කිරීමේ පහසුකම් සහ ප්‍රවාහන පහසුකම්) මෙම ස්ථානය තුළ පවත්වාගෙන යා යුතුය. | ඉදිකිරීම් අදියර | E & S ඒකකය<br>PMU<br>කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| **xi. ආරක්ෂිත ව්‍යුහයන්/ සංඥා පුවරු**<br><br>ඉදිකිරීම් අදියරේදී කම්කරුවන් ඉහළ බෑවුම් ප්‍රදේශවලින් වැටීමේ අවදානම වලක්වා ගැනීම සඳහා ප්‍රමාණවත් ආරක්ෂිත වැටවල් සවිකළ යුතුය. බෑවුම් අස්ථාවරත්වය හා අවදානම ඇති ස්ථානයන්හි සංඥා පුවරු ඉදිකළ යුතුය. ඉදිකිරීම් කටයුතු නොමැති වැසි සමයේදී පවා ඇති අවදානම ඉහළ බැවින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් නොමැති කාලයේදී පවා ආරක්ෂිත සංඥා පුවරු ප්‍රදර්ශනය කිරීම අනිවාර්ය වේ. | ඉදිකිරීම් අදියර | E & S ඒකකය<br>PMU<br>කොන්ත්‍රාත්කරු |
| **xii. ජල සැපයුම් මාර්ගවලට සිදුවන බාධා**<br><br>ඉදිකිරීම් අදියරේදී, ජල සැපයුමට යම් බාධාවක් ඇති වුවහොත් විකල්ප ජල සැපයුමක් ලබාදීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය. ව්‍යාපෘති භූමිය හරහා ජල මාර්ග ගමන් කරන්නේ නම් ජල මාර්ග ආරක්ෂිත ස්ථානයකට ගෙන යාමේ අවශ්‍යතාවය දැනුම් දීමට ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී ජල පරිභෝගිකයන්ගෙන් උපදෙස් ලබා ගත යුතුය. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම්<br>කොන්ත්‍රාත්කරු |
| **xiii. ශ්‍රමිකයින්ගේ සනීපාරක්ෂක පහසුකම්**<br><br>කොන්ත්‍රාත්කරු විසින් වැඩබිම තුල සිටින ශ්‍රමිකයින් සඳහා සනීපාරක්ෂක පහසුකම් සපයා දිය යුතුය. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම්<br>කොන්ත්‍රාත්කරු |
| **xiv. වැඩබිම් කාලය**<br><br>ඉදිකිරීම් කටයුතු දිවා කාලයේදී පමණක් සිදුකළ යුතුය. ආරක්ෂිත හේතූන් මත ප.ව. 6.00 පසුව ඉදිකිරීම් කටයුතු සිදු නොකිරීමට දැඩිව නිර්දේශ කරයි. තවද පොහෝ දිනවල හා විශේෂ අවස්ථා වල විහාරස්ථානයේ සිදුකරන ආගමික කටයුතු වලට මේ හරහා බාධා නොවිය යුතුයි. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම්<br>කොන්ත්‍රාත්කරු |
| **xv. ජනතාවට වැඩබිමට ඇතුළුවීමට හෝ හරහා යාමට අවශ්‍යතාවය**<br><br>දැනුවත් කිරීම් මඟින්, අනතුරු ඇඟවීමේ සංඥා පුවරු මඟින් හා පූර්ණ කාලීන මුරකරුවකු මඟින් මෙම වැඩබිමට අනවසරයෙන් පිවිසීම වලක්වා ගත යුතුය. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම්<br>කොන්ත්‍රාත්කරු |
| **xvi. විධිමත් වැඩබිම් නඩත්තුව**<br><br>ඉදිකිරීම් අතරතුර පාරිසරික අලංකාරවත් බවට සිදුවන අහිතකර බලපෑම අවම කිරීමට කටයුතු කළ යුතුය. | ස්ථානය සකස් කිරීම හා ඉදිකිරීම් අදියර | ඉදිකිරීම්<br>කොන්ත්‍රාත්කරු |
| **xvii. සේවක චර්යා ධර්ම පද්ධතිය**<br><br>කොන්ත්‍රාත්කරු විසින් සේවක චර්යා ධර්ම පද්ධතියක් පවත්වාගෙන යාම මඟින් ස්වාමීන් වහන්සේලා,වන්දනාකරුවන් හා අසල්වාසි ප්‍රජාවන් හා වැඩබිම් සේවකයින් අතර ඇතිවිය හැකි ගැටුම් වැළැක්වීමට කටයුතු කළ යුතුය. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම්<br>කොන්ත්‍රාත්කරු |

- **ස්ථානීය විශේෂිත අධීක්ෂණ අවශ්‍යතා**

ඉදිකිරීම් අදියරේදී මෙම වැඩබිමට විශේෂිතව මිනුම් කළ යුතු පරාමිතීන් වගු අංක 05න් අවධාරණය කරනු ලබයි. මීට අමතරව, කොන්ත්‍රාත්කරුවන්ගේ ESMP සඳහා ඇති අනුකූලතාව දක්වා ඇති අධීක්ෂණ ක්‍රියාපටිපාටිය ඒ ආකාරයෙන්ම ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කළ යුතුය. කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ESMP ක්‍රියාපටිපාටිය ලංසු ලේඛනයේ සඳහන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ESMP සඳහා වන පිරිවැය වෙනම ගෙවුම් අයිතමයක් ලෙස දැක්වීමට අවශ්‍ය වේ. තෝරාගත් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් පාරිසරික හා සමාජ කළමනාකරණ ක්‍රමවේද පිළිබඳ ප්‍රකාශනය ඉදිරිපත් කළ යුතු අතර එය PMU ඒකකය මඟින් අනුමත කිරීමට නියමිතය.

*වගුව 5 – ඉදිකිරීම් අදියර සඳහා පාරිසරික හා සමාජයීය අධීක්ෂණ යාන්ත්‍රණය*

| අධීක්ෂණ අවශ්‍යතා | පරාමිතීන් | අධීක්ෂණ වාර ගණන |
|---|---|---|
| i. මූලික නිරීක්ෂණ | ජලයේ ගුණාත්මකභාවය | - |
| | අවදානමක් සහිත විහාරස්ථ ගොඩනැගිලි හා ව්‍යුහ වල පූර්ව ඉරිතැලීම් සමීක්ෂණ | එක් වරක් * |
| | භූමිය මත සිදුවන කම්පන | එක් වරක් * |
| | වාතයේ ගුණාත්මකභාවය -අංශු ප්‍රමාණය | එක් වරක් * |
| | පසුබිම් ශබ්දය මැනීම | එක් වරක් * |
| ii. ඉදි කිරීම් කාලය අතරතුර | ජලයේ ගුණාත්මකභාවය | - |
| | අවදානමක් සහිත විහාරස්ථ ගොඩනැගිලිවල ඉරිතැලීම් ලක්ෂණ | ඉදිකිරීම් අතරතුර සැලකිය යුතු වෙනස්වීමක් නිරීක්ෂණය කළ හොත් ** |
| | භූමිය මත සිදුවන කම්පන | භූ විදුම්, කැණීම් හෝ වෙනත් කම්පන ඇති කරවන යන්ත්‍ර භාවිතයේදී. * |
| | ඉදිකිරීම් ශබ්ද | අධික ශබ්දය ඇතිවන අවස්ථාවන්හිදී මසකට වරක් * |
| | වාතයේ ගුණාත්මකභාවය -අංශු ප්‍රමාණය | මසකට වරක් * |
| iii. වායු විමෝචනය | වැඩබිම තුළ ක්‍රියාත්මක වන සියලුම යන්ත්‍රෝපකරණ/ වාහන සඳහා විමෝචන පාලන පරීක්ෂණ සහතිකය තිබිය යුතුය - වැඩබිමෙහි ES නිලධාරී විසින් පරීක්ෂා කළ යුතුය. | |
| iv. නිරීක්ෂණ ආයතන | * ඉරිතැලීම් සමීක්ෂණ හැර අනෙකුත් සියලුම පරාමිතීන් අධ්‍යනය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ලියා පදිංචි ස්වාධීන නිරීක්ෂණ ආයතනයක් යොදා ගත යුතුය.<br><br>**ඉරිතැලීම් සමීක්ෂණ PMU මඟින් අනුමැත ආයතනයක් මඟින් මෙහෙය විය යුතුය. | |
| v. අවශ්‍යතා වාර්තා කිරීම | **ස්වභාවික ඇළ මාර්ග වල ජලයේ ගුණාත්මක භාවය** – මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2017 වර්ෂයේ ප්‍රකාශයට පත්කරන ලද ස්වභාවික ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ පරාමිතීන් සමඟ සංසන්දනය කිරීම<br><br>**ගොඩනැගිලිවල පූර්ව ඉරිතැලීම් සමීක්ෂණය** - වෘත්තීය වාර්තාව<br><br>**භූමිය මත ඇතිවන කම්පන** - යන්ත්‍රෝපකරණ ,ඉදිකිරීම් ක්‍රියාකාරකම් සහ වාහන වල චලනයන් සඳහා *CEA*හි කම්පන පිළිබඳ අන්තර්ගත ප්‍රමිතීන් | |

| | |
|---|---|
| | **පසුබිම් ශබ්ද** – අතිරේක ගැසට් පත්‍රය අංක 924.1 ,මැයි 23 ,1996 ,මධ්‍යම පරිසර අධිකාරිය<br><br>**වායු වල ගුණාත්මකභාවය ,අංශු පරික්ෂාව** - 2008 අගෝස්තු මස 15 වන දින අංක 1562/22 දරණ ඇති විශේෂ ගැසට් පත්‍රය යටතේ ජාතික වායු ප්‍රමිතීන් - මධ්‍යම පරිසර අධිකාරිය |

## 10. මහජන හා පාර්ශවකරුවන්ගේ අදහස්

*වගුව 6– මහජන හා පාර්ශවකරුවන්ගේ අදහස්*

| ආයතනය | නම | යොමු කරන ලද ගැටලු |
|---|---|---|
| ඉසිපතන මහමෙව්නා අසපුව | විහාරාධිකාරී, විජිතවංස හිමි | ✓ දාගැබ් වහන්සේට යාබදව යෝජිත ආපදා අවමකරණ ක්‍රියාමාර්ග සිදුකරන බැවින් එම ව්‍යුහයන් අවම ලෙස ඉස්මතු වන ලෙස ඉදිකිරීම් කළ යුතුය.<br>✓ ඉදිකිරීම් අදියරෙන් පසු මෙම ස්ථානයට යාබද ප්‍රවේශ මාර්ගය නිසි ලෙස සකස් කළ යුතුයි.<br>✓ වෘක්ෂලතා ආවරණය ආරක්ෂා වන පරිදි ඉදිකිරීම් සිදුකළ යුතු අතර ඉදිකිරීම් අවසාන කිරීමෙන් පසු වෘක්ෂලතා නැවත වගා කළ යුතුයි.<br>✓ ඉදිකිරීම් කාලය තුළ විහාරස්ථාන කටයුතු සහ වන්දනාකරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වීම.<br>✓ පෝය දින සහ අනෙකුත් උත්සව කාල තුළ ආගමික කටයුතුවලට වන බාධා අවම කිරීම. |
| අසල්වැසි ප්‍රජාව | සේරුපිට ජනපදය, කළුතර උතුර ලිපින වල, ඉසිපතන මහමෙව්නා අසපුවට යාබදව පදිංචි,<br>ඩී. ජිනදාස මයා<br>කේ.ඩී.කරුණරත්න මයා<br>වයි. පුෂ්පලතා මිය | ✓ අසල්වැසියන්ගෙන් බොහෝ දෙනෙක් මෙම ස්ථානයේ සිදුකරන අවම කිරීමේ ක්‍රියාමාර්ග අගය කරනු ලබයි. මෙහි සිදුවූ නායයෑම්වලින් පසු වැසි දිනවලදී පෙර නොවූ විරු ජල මාර්ග මතු වී ඇත.<br>✓ මෙම ස්ථානයේ ඉදිකිරීම් කටයුතු වලදී ශබ්දය, කම්පන සහ දූවිලි ආදීය ජනනය විය හැකි අතර හා එහි බලපෑම ඔවුන්ගේ නිවාස ඒකක වලට බලපෑම් කරනු ලබයි.<br>✓ ඉදිකිරීම් කටයුතු පිළිබඳ ආකල්පය; කම්කරුවන් සහ ඔවුන්ගේ හැසිරීම් පිළිබඳ ඔවුන්ගේ ආකල්ප මතු කරන ලදී. |

## 11. ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍ය අධිකාරිය විසින් නිකුත් කරන ලද COVID-19 සඳහා වන වැළැක්වීමේ පියවර

**COVID-**19, නව කොරෝනා වයිරස් ආසාදනය ලෝකයෙන් සම්පූර්ණයෙන්ම තුරන් කර නැත. එබැවින්, ආසාදනය පැතිරීම වැලැක්වීම / පාලනය කිරීම සඳහා, රෝග ලක්ෂණ සහිත ආසාදිතයන් හඳුනාගැනීමේදී ඇතිවන තැතිගැන්ම වැළැක්වීම සඳහා, සියලුම කොන්ත්‍රාත්කරුවන් **COVID -** 19

සුදානම් සැලැස්මක් සකස් කිරීම අවශ්‍ය වන අතර "**COVID - 19** පැතිරී යාමේදී අනුගමනය කළ යුතු සෞඛ්‍ය සහ ආරක්ෂිත මාර්ගෝපදේශ" අනුව ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය **CIDA** විසින් 2020 අප්‍රේල් 29 වන දින ලබා දුන් මාර්ගෝපදේශ ආපදා අවමකරණ ස්ථානය තුළ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

## 12. නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව, එකඟතාවය සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ආයතනයන්හි අනුමැතිය ලබා ගැනීම

*වගුව 7 – නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව, එකඟතාවය හා අනුමැතිය*

| අවශ්‍යතා / අනුමත කිරීම් / ආයතන | ව්‍යාපෘතියට ඇති අදාලත්වය |
|---|---|
| **12.1** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | |
| දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය | ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට දිස්ත්‍රික් ලේකම් වරයාගේ අනුමැතිය ලබා ගැනීමට සිදුවනු ඇති අතර මෙහිදී දේශපාලන අධිකාරිය සහ දිස්ත්‍රික්කයේ වගකිව යුතු ආයතන සහභාගී වන දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුව හමුවේ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කල යුතු වේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ නිලධාරියෙකු ව්‍යාපෘතිය පිලිබඳ විස්තර කරමින් එහි විවිධ පාරිසරික සහ සමාජීයය ගැටළු ආදිය ගැන විස්තර කරනු ඇත .මෙම ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වමින් මෙම රැස්වීමේදී ගනු ලබන නිර්දේශ මෙම පාරිසරික සහ සමාජීයය කළමනාකරණ සැලසුම ක්‍රියාවට නංවන විට සැලකිල්ලට ගැනෙනු ඇත . |
| සැලසුම් කමිටුවේ අනුමැතිය | දොඩංගොඩ ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීම |
| **12.2** ව්‍යාපෘතියට අදාළ රජයේ ඉඩම් හිමියන්ගේ අනුමැතිය | |
| මධ්‍යම පරිසර අධිකාරිය | ව්‍යාපෘතිය ජාතික පාරිසරික රෙගුලාසිවලට අනුකූල විය යුතු බැවින් මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය අවශ්‍ය වේ. |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | වන රක්ෂිත සහ වනජීවී වාසස්ථාන නොමැති බැවින්; වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ වනජීවී දෙපාර්තමේන්තුවේ අනුමැතිය අවශ්‍ය නොවේ. |
| භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය | ගොඩනැගිළි ද්‍රව්‍ය කැණීම් කිරීම, පාෂාණ සහ ඛනිජ ද්‍රව්‍ය ප්‍රවාහනය සහ සුන්බුන් බැහැර කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම. (අවශ්‍යනම් පමණක්) |
| දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව | අපද්‍රව්‍ය බැහැර කිරීම සහ කොළ රොඩු ඉවත් කිරීම සඳහා දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙතින් අනුමැතිය ලබා ගැනීම. |
| ලංකා විදුලිබල මණ්ඩලය | වැඩබිම් අවශ්‍යතා සඳහා විදුලිය ලබාගැනීමට ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයේ අනුමැතිය |
| ජාතික ශාක නිරෝධායන සේවය | මෙම ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජෛව ව්‍යාපෘති කළමනාකරණය යොදා ගැනීම සඳහා පැලෑටි හෝ බීජ අවශ්‍ය වේ නම්(ආනයනය කල යුතු නම් ) 1999 අංක 35 දරණ පැලෑටි සංරක්ෂණ පනත යටතේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් ,අතිරේක අධ්‍යක්ෂ කටුනායක ජාතික ශාක |

| | |
|---|---|
| | නිරෝධායන සේවය අනුමත කල පැලෑටි හෝ බීජ අධිකාරිය මඟින් නිකුත් කරන බලපත්‍රය සහ කොන්දේසි යටතේ ගෙන ආ යුතුය . |
| **12.3** පෞද්ගලික ඉඩම් හිමිකාරිත්වයෙන් කැමැත්ත/ විරුද්ධත්වයක් නොමැති බව/ නිත්‍යානුකූල ගිවිසුම | |
| ඉඩම් හිමිකරු( විහාරස්ථානය) | භූමියට පිවිසීම , පවතින ව්‍යුහයන් ඉවත් කිරීමට විරුද්ධ නොවීම සහ දිගු කාලින නඩත්තු කටයුතු වල නිරත වීමට කිසිදු බාධාවක් නොකරන බවට ඉඩම් හිමියන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය අතර නිත්‍යානුකූල බැඳීමක් සහිත ගිවිසුමක් අත්සන් කල යුතුය. |

අනුමත කිරීම සඳහා නියමිත කාල පරාසය 8 වගුවේ දක්වා ඇත.

*වගුව 8 – අනුමැතීන් ලබා ගැනීම සඳහා වන දළ කාල නියමය*

| අනුමත කිරීම | මාසය 1 | | | | මාසය 2 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සතිය 1 | සතිය 2 | සතිය 3 | සතිය 4 | සතිය 1 | සතිය 2 | සතිය 3 | සතිය 4 |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් අනුමැතිය ලබා ගැනීම**<br>අයදුම්පත් ඉදිරිපත් කිරීම<br>ව්‍යාපෘති සාකච්ඡාව<br>අදහස් වලට ප්‍රතිචාර දැක්වීම<br>අනුමැතිය | | | | | | | | |
| **සැලසුම් කමිටුවේ අනුමැතිය**<br>අයදුම්පත් ඉදිරිපත් කිරීම<br>ව්‍යාපෘති සාකච්ඡාව<br>අදහස් වලට ප්‍රතිචාර දැක්වීම<br>අනුමැතිය | | | | | | | | |
| **වෙනත් අනුමැතීන්**<br>භූ විද්‍යා සහ පතල් කාර්යාංශය<br>ආරක්ෂක අමාත්‍යාංශය<br>(අවශ්‍යතාවය අනුව පදනම් වේ) | | | | | | | | |
| ඉඩම් හිමිකරුවන්ගේ කැමැත්ත /විරෝධතාවයක් නොමැත | | | | | | | | |

## 13. වැඩබිම සම්බන්ධ අභියාචනා සලකා බැලීමේ යාන්ත්‍රණය

මෙම ව්‍යාපෘතිය හේතුවෙන් සිදුවිය හැකි ගැටළු සම්බන්ධයෙන් අභියාචනා මණ්ඩල පිහිටුවීම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාරිසරික හා සමාජයීය නිලධාරී විසින් සිදු කල යුතුය. (අභියාචනා මණ්ඩල පිහිටුවීමට අදාල නිර්දේශ පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව (ESMF) යටතේ සපයා ඇත.)

## 14. තොරතුරු බෙදාහැරීම

පහත දැක්වෙන නියෝජිතායතන අතර අවශ්‍ය තොරතුරු බෙදාහැරීම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ වගකීම වන අතර ඒ සඳහා භාවිත කළ හැකි ක්‍රමවේද වගුවේ දක්වා ඇත.

*වගුව 9 – යෝජිත තොරතුරු බෙදාහැරීමේ යාන්ත්‍රණය*

| තොරතුරු | යෝජිත ආයතන | තොරතුරු අනාවරණය කිරීමේ ක්‍රමවේදය |
|---|---|---|
| i. ව්‍යාපෘති සැලැස්ම (ස්ථානීය තොරතුරු ,පිරිසැලසුම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු) | දිස්ත්‍රික් ලේකම් ,ප්‍රාදේශීය ලේකම්, විහාරාධිපති, අනෙකුත් දිස්ත්‍රික්ක මට්ටමේ නියෝජිතායතන, ජා.ගො.ප.සං.යේ දිස්ත්‍රික් කාර්යාලය, AIIB බැංකුව | රැස්වීම් ,දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුව ,ගිවිසුම්, අනුමැතින් සහ කැමැත්ත අත්සන් කිරීම සඳහා අදාළ වාර්තා ඉදිරිපත් කිරීම |
| ii. පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, AIIB බැංකුව | රැස්වීම් ,දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුව ,ගිවිසුම්,අනුමැතින් සහ කැමැත්ත අත්සන් කිරීම සඳහා අදාළ වාර්තා ඉදිරිපත් කිරීම. |
| iii. අධීක්ෂණ වාර්තා (මූලික වාර්තා සහ ඉදිකිරීම් කාලය තුල) | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, AIIB බැංකුව සහ අදාළ පාර්ශවයන් | ප්‍රගති සමාලෝචන රැස්වීම් ,විශේෂ රැස්වීම් ,අදාළ වාර්තා ඉදිරිපත් කිරීම |
| iv. පාරිසරික සුරක්ෂිතතාවය සහ ශ්‍රමිකයින්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව පිලිබඳ ස්ථානීය පරික්ෂාව | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, ප්‍රාදේශීය ලේකම්, විහාරාධිකාරී ස්වාමීන්ද්‍රයන් වහන්සේ, ග්‍රාමනිලධාරී , ජා.ගො.ප.සං.යේ දිස්ත්‍රික් කාර්යාලය, AIIB බැංකුව සහ අදාළ පාර්ශවයන් | ලිඛිත සහ වාචික සන්නිවේදනය ,අදාළ වාර්තා ඉදිරිපත් කිරීම |
| v. ES අනුව තීරණ ගැනීම හා ප්‍රගති සමාලෝචන රැස්වීම් | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, ප්‍රාදේශීය ලේකම්, විහාරාධිකාරී ස්වාමීන්ද්‍රයන් වහන්සේ, ග්‍රාමනිලධාරී, ජා.ගො.ප.සං.යේ දිස්ත්‍රික් කාර්යාලය, AIIB බැංකුව සහ අදාළ පාර්ශවයන් | රැස්වීම් , අදාළ වාර්තා ඉදිරිපත් කිරීම |
| vi. දුක් ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය | AIIB බැංකුව, විහාරාධිකාරී ස්වාමීන්ද්‍රයන් වහන්සේ සහ අදාළ පාර්ශවයන් | රැස්වීම්, ලිඛිත හා වාචික සන්නිවේදනය |

## ඇමුණුම I: ආපදා අවමකරණ ස්ථානය ආශ්‍රිත පරිසරය හා මහජන දැනුවත් කිරීම්

| | |
|---|---|
|  |  |
| විහාරස්ථ ස්වාමීන් වහන්සේලා සමග සාකච්ඡා කිරීම | යෝජිත අවමකරණ ස්ථානයට යාබද නිවැසියන් සමග සාකච්ඡා කිරීම |
|  |  |
| ආපදා අවම කිරීමේ ස්ථානය | ආපදා අවම කිරීමේ ස්ථානයට යාබදව ඉදිකර ඇති රැඳවුම් බැම්ම |
|  |  |
| ආපදා අවම කිරීමේ ස්ථානය | යාබද නිවාස |